Service, redefined. Continental® INSURANCE

# කොන්ටිනන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය **PB 3784**


**ප්‍රධාන කාර්යාලය, අංක 79, ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නංගර මාවත, කොළඹ 07.**
**දුරකථන: 011 5200300 ෆැක්ස්: 011 5200350**
**වෙබ් : www.cilanka.com**


## මෝටර් රථවාහන රක්ෂණ ඔප්පුව

මෙහි අන්තර්ගත උපලේඛනයෙහි විස්තර කර ඇති රක්ෂිතයා (මින් මතු "රක්ෂිතයා" යනුවෙන් හඳුන්වනු ලැබේ) මෙම ගිවිසුමෙහි පදනම වශයෙන්ද මෙහි අන්තර්ගතවී ඇතැයිද සැලකෙන යෝජනාපත්‍රයක් සහ ප්‍රකාශයක් මගින් **කොන්ටිනන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්** (මින් මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලැබේ) වෙත මෙහි අන්තර්ගත රක්ෂණය සඳහා ඉල්ලුම්කර ඇති හෙයින්ද, එම රක්ෂණය සඳහාවූ ප්‍රතිෂ්ඨාව වශයෙන් ඉහත උපලේඛනයෙහි සඳහන්කර ඇති වාරික මුදල ගෙවා හෝ ගෙවීමට එකඟ වී ඇති හෙයින්ද,

ඉහත උපලේඛනයෙහි සඳහන්කර ඇති ආවරණ කාලසීමාව තුල හෝ මෙම ඔප්පුව අලුත්කිරීම වෙනුවෙන් ගෙවීමක් භාරගනු ලැබියහැකි යම් කාලසීමාවක් තුලදී සිදුවන හදිසි අනතුරුමය හානි හෝ අලාභ වෙනුවෙන් මෙහි අන්තර්ගතවී ඇති හෝ පිටසන් යොදා ඇති හෝ මෙහි වෙනත් ආකාරයකින් ප්‍රකාශකර ඇති නියමයන්, බැහැරකිරීම් සහ කොන්දේසිවලට යටත්ව පහත විස්තර කරඇති ආකාරයෙන් සමාගම විසින් වන්දි ගෙවනු ලබන බවට මෙම ඔප්පුව සාක්ෂි දරනු ඇත:

### 1 වෙනි කොටස : වාහනයට සිදුවන අලාභ හෝ හානි

1. රක්ෂණය කරන ලද යම් වාහනයකට සහ / හෝ එහි උපාංග සහ එයට සවිකොට ඇති අමතර කොටස්වලට පහත සඳහන් හේතූන් නිසා සිදුවන අලාභ හෝ හානියට එරෙහිව සමාගම විසින් හදිසි අනතුරු සිදුවන අවස්ථාවේදී එම වාහනයේ තක්සේරු වටිනාකම හෝ වෙළෙඳපොල වටිනාකම යන දෙකෙන් අඩු ප්‍රමාණය රක්ෂිතයාට වන්දි වශයෙන් ගෙවනු ලැබේ.

    (අ) අහඹුමය බාහිර හේතූන්

    (ආ) ගිනි, බාහිර පිපිරීම්, ස්වයං ගිනිගැනීම්, අකුණුසැර හෝ මංකොල්ලය, ගෙවල්බිඳීම් හෝ සොරකම්

    (ඇ) ද්වේශසහගත ක්‍රියා

    (ඈ) මහාමාර්ගයේ, දුම්රිය මාර්ගයේ, දේශීය ජල මාර්ගයේ, සෝපානයේ හෝ ඔසවනයේ රැගෙන යනවිට

    එහෙත් පහත සඳහන් සිදුවීම් බැහැර කෙරේ:

    (i) එකම අවස්ථාවකදී වාහනයටද අනෙකුත් අලාභ සිදුවූවහොත් මිස ටයර් සහ ටියුබ්වලට, රබර් අයිතමවලට සිදුවන හානි. මෙවන් අවස්ථාවලදී ටයර් සහ ටියුබ්වලට, රබර් අයිතම සහ එන්ජින් කොටස්වලට සිදුවන හානි වෙනුවෙන් සමාගම විසින් ගෙවනු ලබන හානිපූරණයේ ප්‍රමාණය ප්‍රතිස්ථාපන වියදමෙහි සියයට 50 නොඉක්මවිය යුතුය.

    (ii) පෞද්ගලික කාර් වශයෙන් රක්ෂණය කර ඇති වාහන හැර එකම අවස්ථාවකදී වාහනයද සොරකම් කරනු ලැබුවහොත් මිස මංකොල්ලය ගෙවල්බිඳීම් හෝ සොරකම් කිරීම් හේතුවෙන් උපාංග, අමතර කොටස් හෝ අත්‍යවශ්‍ය කොටස්වලට සිදුවන අලාභ හෝ හානි.

    (iii) බස්රථ, ඔම්නි බස්රථ, මෝටර් කෝච් වශයෙන් ලියාපදිංචි කර ඇති වාහනවල සුලංවාමුවා / ජනෙල්වලට සිදුවන,

        (අ) ඉහත මෝටර් රථ වාහනයේ රක්ෂිතයාගේ තක්සේරු අගය (උපාංග සහ අමතර කොටස් ඇතුලුව)

        (ආ) ඉහත මෝටර් රථ වාහනයේ අගය (උපාංග සහ අමතර කොටස් ඇතුලුව) යන දෙකෙන් අඩු අගයෙහි සියයට 10 කටත් වඩා වැඩි අලාභ හෝ හානි,

    (iv) කුලී අරමුණු සඳහා රක්ෂණය කර ඇති සියලුම වාහනවල ලාම්පු, ටයර්, මඩ කවර, බපර්, බපර් ඒප්රන්, බපර් බ්‍රැකට් සහ / හෝ සායම් වැඩ යනාදියට සිදුවන අලාභ හෝ හානි.

    (v) එකම අවස්ථාවකදී වාහනයටද අනෙකුත් අලාභ සිදුවූවහොත් මිස එයාර්බෑග් වලට සිදුවන අලාභ හෝ හානි. මෙම කුමන අවස්ථාවකදී වූවද, එයාර්බෑග් සඳහාවූ සමාගමෙහි වගකීම එය අලුතින් ආදේශ කිරීමට යන වියදමෙහි සියයට 50 නොඉක්මවයි.

**වැදගත්:**
ඔබගේ ආරක්ෂාව සඳහා මෙම ඔප්පුව හොඳින් කියවන්න. එහි යම් වැරැද්දක් දක්නට ලැබුණහොත් හෝ ලබාදී ඇති ආවරණය ඔබගේ අවශ්‍යතාවලට අනනුකූලවූවහොත් නිවැරදි කිරීම සඳහා ඔප්පුව වහාම සමාගම වෙත ආපසු යැවිය යුතුය.

**සැ. යු.:**
ඉහත දැක්වෙනුයේ කොන්ටිනන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්හි **"MOTOR VEHICLE INSURANCE"** මුල් ඔප්පුවෙහි අනුවාදයක් පමණි. යම්කිසි අනනුකූලතාවයකදී හෝ නීතිමය ගැටළුවකදී බලපැවැත්වෙනුයේ එකී ඉංග්‍රීසි මුල් පිටපත බව සැලකුව මැනවි.

2. අනුෂාංගික හානි, ක්‍ෂයවීම, වැහැරීම් සහ ගෙවීයාම්, යාන්ත්‍රික හෝ විදුලිමය දෝෂ, තිරිංග ක්‍රියාත්මක නොවීම, මයික්‍රෝ චිප්, සවිකර ඇති චිප්, අනුකලිත පරිපථ හෝ ඒ හා සමාන උපකරණ යම් දිනයක් හෝ ලිත් දිනයක් නිවැරදිව හඳුනාගැනීමට අපොහොසත් වීම ඇතුළුව, අධිබර හෝ එම වාහනයේ ගෙනයනු ලබන බර හෝ එහි ස්වභාවය හේතුවෙන් ඇතිවන හානි සම්බන්ධයෙන් කිසිම ගෙවීමක් කිරීමට සමාගම බැඳී නොමැත.

3. රක්‍ෂිතයා සෑම සිදුවීමක් සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ප්‍රමාණය හෝ ඔප්පු උපලේඛනයේ සඳහන් කර ඇති වෙනත් යම් ප්‍රමාණය (හෝ දැරියහැකි එයටත් වඩා අඩු වියදමක්) හෝ මේ යටතේ ඇති යම් වියදම් භාරගත යුතුය. මේ යටතේ රක්‍ෂිතයා වගකිව යුතුවන ප්‍රමාණයට සමාගම විසින් දරන ලද වියදම්ද ඇතුලත්වන්නේ නම්, එම මුදලද රක්‍ෂිතයා වහාම සමාගමට ආපසු ගෙවිය යුතුය. මෙම වගන්තිය යටතේ හානිපූරණය කරනු ලබන මෙම උපවගන්තියෙහි අරමුණ සඳහා **සිදුවීම** යන යෙදුමෙහි, මෙම වගන්තිය යටතේ වන්දි ගෙවනු ලබන යම් වාහනයක් හා සම්බන්ධ යම් හේතුවක් නිසා ඇතිවන යම් සිදුවීමක් හෝ සිදුවීම් සමූහයක් යන අර්ථයද අඩංගුවේ.

| | | |
|---|---|---|
| i) | පෞද්ගලික කාර් | නොමැත |
| ii) | මෝටර් සයිකල් | පළමු රුපියල් 500 |
| iii) | සියළුම කුලී වාහන | පළමු රුපියල් 1000 |

4. මෙම ඔප්පුව යටතේ ආවරණය සපයා ඇති අලාභ හෝ හානි හේතුවෙන් ඉහත වාහනය ධාවනය කළ නොහැකි තත්ත්වයට පත්වූවහොත් එම වාහනය ආරක්‍ෂාකාර සමාගම විසින් පිළිගත් ළඟම ඇති ගරාජයකට රැගෙන ගොස් රක්‍ෂිතයාට ආපසු භාරදීම දක්වා ඇතිවන සාධාරණ වියදම් සමාගම විසින් දරනු ලබන නමුත් එම ප්‍රමාණය යම්කිසි එක් හදිසි අනතුරක් සඳහා මෝටර් සයිකල් නම් රුපියල් 500 ද අනෙකුත් වාහන නම් රුපියල් 2,500 ද නොඉක්මවනු ඇත.

5. මෙම ඔප්පුව යටතේ සමාගම වගකිව යුතුවන අලාභයක් අදාල වාහනයට සිදුවූවහොත් ඒ පිළිබඳව වහාම සමාගමට දැන්විය යුතු අතර සමාගමේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව එය අලුත්වැඩියා කිරීමේ කිසිම කටයුත්තක් ඇරඹීම හෝ එම වාහනයේ යම් කොටසක් ඉවත්කිරීම හෝ වාහනය අළුත්වැඩියා කිරීම සඳහා යම් ඇස්තමේන්තුවක් රක්‍ෂිතයා විසින් භාරගැනීමක් සිදුනොකළ යුතුය.

### හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනා

6. පහත සඳහන් කර ඇති රක්‍ෂිත කාලයක් තුලදී මෙම ඔප්පුව යටතේ හිමිකමක් ඉදිරිපත් කරනු නොලැබුවහොත් හෝ හිමිකමක් ඇති නොවූවහොත් ඒ සමගම එළඹෙන ඊළඟ ඔප්පු අළුත්කිරීමකදී එකී කාලයට අදාළව ගෙවිය යුතු අළුත්කිරීමේ වාරිකය පහත සඳහන් පරිදි අඩුකරනු ලැබේ:

| | මෝටර් සයිකල් සඳහා අදාලවන ප්‍රතිශතය | වෙනත් වාහන සඳහා අදාලවන ප්‍රතිශතය |
|---|---|---|
| පළවෙනි අළුත්කිරීම | 10 | 15 |
| දෙවෙනි අළුත්කිරීම | 15 | 20 |
| තෙවෙනි අළුත්කිරීම | 20 | 25 |
| සිවුවෙනි අළුත්කිරීම | 25 | 30 |
| පස්වෙනි අළුත්කිරීම | -- | 40 |
| හයවෙනි අළුත්කිරීම | -- | 50 |
| හත්වෙනි අළුත්කිරීම | -- | 65 |

මෙම ඔප්පුවේ අයිතිය පැවරීමක් සඳහා සමාගම එකඟවූවහොත් පැවරුම්කරු සතුව අයිතිය තිබූ අදාල කාලසීමාව තුල උපයාගත් ප්‍රසාද දීමනාව පැවරුම්ලාභියාගේ ප්‍රතිලාභයට එකතු කරනු නොලැබේ.

මෙම ඔප්පුවේ උපලේඛනයේ එකකට වඩා වැඩි වාහන සංඛ්‍යාවක් සඳහන් කර තිබුණහොත් එවන් එක් එක් වාහන සඳහා වෙන වෙන් වශයෙන් ඔප්පු නිකුත් කර ඇතිසේ සලකා හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාව අදාල කරනු ලැබේ.

## 2 වෙනි කොටස : තෙවන පාර්ශව වගකීම්

### (අ) පෞද්ගලික කාර් සඳහා පමණක් අදාලවේ

1. ඉහතකී උපලේඛනයේ / උපලේඛනවල විස්තර කර ඇති යම් මෝටර් රථවාහනයකින් හෝ එම වාහනය සම්බන්ධවන්නා වූ හෝ ඒ මගින් හදිසිඅනතුරක් සිදුවූවහොත්, පහත සඳහන් සිද්ධීන් සම්බන්ධයෙන් හිමිකම් පාන්නා වෙනුවෙන් නෛතිකව ගෙවීමට යටත්වන හිමිකම් ගාස්තු සහ වියදම් ඇතුළු සියළුම මුදල් ගණන්වලට සමාගම විසින් මෙම ඔප්පුවේ සඳහන් කරඇති වගකීමේ සීමාවන්ට යටත්ව හානිපූරණය කරනු ඇත:

(අ) යම් පුද්ගලයකු මරණයට පත්වීම හෝ ඔහුට / ඇයට ඇතිවන ශාරීරික තුවාල. එවන් මරණය හෝ තුවාලය රක්‍ෂිතයා යටතේ රැකියාවක නිරතවී සිටින විටදී හෝ එම රැකියාව හේතුවෙන් සිදුවී ඇත්නම්, එය බැහැර කෙරෙන අතර එම මෝටර් රථවාහනයේ ගමන් කරන මගියකු හෝ රක්‍ෂිතයාගේ පවුලේ සාමාජිකයෙක් වන යම් පුද්ගලයෙක් සම්බන්ධ වගකීමද බැහැර කෙරේ.

(ආ) රක්‍ෂිතයාගේ හෝ රක්‍ෂිතයාගේ පවුලේ සාමාජිකයකුගේ භාරයේ හෝ රැකවරණයේ හෝ පාලනයේ තිබෙන දේපළ හෝ ඔවුන්ගේ වාහනවල ගෙනයනු ලබන දේපළ හැර අනෙකුත් දේපළවලට සිදුවන හානි.

2. සමාගමෙහි ලිඛිත අනුමැතිය සහිතව දරනලද සියළුම වියදම් සමාගම විසින් ගෙවනු ලැබේ.

3. මෙම කොටස මගින් ප්‍රදානය කර ඇති රක්‍ෂිතයා හානිපූරණය කිරීමේ සීමාවට යටත්ව සහ ඒ අනුව සමාගම විසින් එම වාහනය පදවන යම් පුද්ගලයකුට ඔහු / ඇය පහත සඳහන් කරුණු ඉටුකර ඇතොත් හානිපූරණය කෙරෙනු ඇත:

(අ) ඔහු / ඇය වෙනත් යම් රක්‍ෂණ ඔප්පුවක් යටතේ හානිපූරණය කරගැනීම සඳහා අයිතිවාසිකම් නොමැත්තෙකු විය යුතුය.

(ආ) ඔහු / ඇය රක්‍ෂිතයා මෙන් මෙම ඔප්පුවේ නියමයන්ට, ව්‍යාතිරේකවලට සහ කොන්දේසිවලට යටත්ව, එය අදාලවනතෙක් එයට එකහවී එය පිළිපැදිය යුතුය.

4. රක්‍ෂිතයාට අයිතියක් නොමැති සහ කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ඔහු / ඇයට කුලියට ලබාගෙන නොමැති පෞද්ගලික මෝටර් රථ වර්ගයට අයත් (එහෙත් මෝටර් සයිකලයක් නොවේ) මෙම උපලේඛනයේ විස්තර කර ඇති ඕනෑම මෝටර් රථයක් රක්‍ෂිතයා විසින් තමාම පදවාගෙන යනු ලබන විටදී මෙම වගන්තිය යටතේ ප්‍රදානය කර ඇති හානිපූරණය කිරීමේ සීමාවට යටත්ව, සමාගම විසින් හානිපූරණය කරනු ලැබේ.

5. මෙම කොටස යටතේ වන්දි ලබාගැනීමට අයිතියක් ඇති යම් පුද්ගලයෙක් මරණයට පත්වූවහොත් එම පුද්ගලයා විසින් දරනලද වගකීම් සම්බන්ධයෙන් ඔහුගේ / ඇයගේ පෞද්ගලික නියෝජිතයින්ට, ඔවුන් රක්‍ෂිතයා මෙන් මෙම ඔප්පුවේ නියමයන්, ව්‍යාතිරේක සහ කොන්දේසි අදාල වියහැකි තාක්කල් එය පිළිපදිමින්, ඉටුකරමින් සහ එයට යටත්ව සිටියහොත්, මෙම කොටසේ නියමයන්ට සහ සීමාවන්ට යටත්ව, පෞද්ගලික නියෝජිතයන් හානිපූරණය කරනු ඇත.

6. මෙම කොටස යටතේ වන්දි ගෙවීමේ විෂයය වියහැකි යම් මරණයක් සම්බන්ධයෙන් පවත්වනු ලබන යම් හදිසි මරණ පරීක්‍ෂණයකදී සමාගමට එහි අභිමතය පරිදි නියෝජිතයන් නියම කරගතහැකි අතර, මෙම කොටස යටතේ වන්දි ගෙවීමේ විෂයයක් වියහැකි යම් සිද්ධියක් හේතුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් වූ යම් ක්‍රියාවක් හෝ සිදුවී ඇතැයි කියනු ලබන වැරැද්දක් සම්බන්ධයෙන් යම් මහේස්ත්‍රාත් අධිකරණයකදී හෝ ප්‍රථම අවස්ථා උසාවියකදී හෝ පවත්වනු ලබන නඩුවකදී විත්තිය ආරක්‍ෂා කිරීමේ ක්‍රියාපටිපාටිය භාරගත හැකිය.

**වගකීම්වල සීමාවන්**
**පෞද්ගලික කාර්**

2 (අ) කොටස යටතේ සමාගමේ වගකීමෙහි සීමාව
1. (අ) සීමාරහිතයි
2 (අ) කොටස යටතේ සමාගමේ වගකීමෙහි සීමාව
1. (ආ) එක් සිද්ධියකින් ඇතිවන යම් එක් හිමිකමක් හෝ හිමිකම් මාලාවක් සම්බන්ධයෙන් උපරිම වගකීමෙහි සීමාව රුපියල් මිලියන 15කි.

**(ආ) මෝටර් සයිකල් සඳහා පමණක් අදාලවේ**

1. ඔප්පුවෙහි සඳහන් කර ඇති වගකීම් සීමාවන්ට යටත්ව, උපලේඛනයෙහි / උපලේඛනවල විස්තර කර ඇති යම් මෝටර් සයිකලයක් සම්බන්ධයෙන් හෝ ඒ මගින් හෝ එහි හේතුවෙන් සිදුවන හදිසි අනතුරකදී පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට රක්ෂිතයා බැඳී සිටින හිමිකම් පාන්නාගේ වියදම් සහ ගාස්තු ඇතුලු සියලුම වියදම් සමාගම විසින් රක්ෂිතයා හානිපූරණය කරනු ලැබේ:

   (අ) යම් පුද්ගලයකු මරණයට පත්වීම හෝ ඔහුට / ඇයට ඇතිවන ශාරීරික තුවාල. එවන් මරණය හෝ තුවාලය රක්ෂිතයා යටතේ රැකියාවක නිරතවී සිටිනවිටදී හෝ එම රැකියාව හේතුවෙන් සිදුවී ඇත්නම්, එය බැහැර කෙරෙන අතර එම මෝටර් සයිකලයේ රැගෙන යනු ලබන යම් පුද්ගලයෙක් සම්බන්ධ වගකීමද බැහැර කෙරේ. එම පුද්ගලයා රැකියා ගිවිසුමක් හේතුවෙන් රැගෙන යනු ලබන්නේ නම් බැහැර නොකෙරේ.

   (ආ) රක්ෂිතයාට අයිති හෝ රක්ෂිතයාගේ පවුලේ සාමාජිකයකුගේ භාරයේ හෝ රැකවරණයේ හෝ පාලනයේ තිබෙන දේපළ හෝ එම මෝටර් සයිකලයේ රැගෙන යනු ලබන දේපළ හෝ හැර අනෙකුත් දේපළවලට සිදුවන හානි.

2. සමාගමෙහි අනුමැතිය සහිතව දරන ලද සියළුම වියදම් සමාගම විසින් ගෙවනු ලැබේ.

3. රක්ෂිතයාට අයිතියක් නොමැති සහ කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ඔහු / ඇයට කුලියට ලබාදී නොමැති පෞද්ගලික මෝටර් සයිකල් වර්ගයට අයත් මෙම උපලේඛනයේ විස්තර කර ඇති ඕනෑම මෝටර් සයිකලයක් රක්ෂිතා විසින් තමාම පදවාගෙන යනු ලබන විටදී මෙම වගන්තිය යටතේ ප්‍රදානය කර ඇති හානිපූරණය කිරීමේ සීමාවට යටත්ව, සමාගම විසින් හානිපූරණය කරනු ලැබේ.

4. මෙම කොටස යටතේ හානිපූරණයක් ලබාගැනීමට අයිතියක් ඇති යම් පුද්ගලයෙක් මරණයට පත්වුවහොත් එකී පුද්ගලයා විසින් දරන ලද වගකීම වෙනුවෙන් සමාගම ඔහුගේ පෞද්ගලික නියෝජිතයන්ට, ඔවුන් රක්ෂිතයා මෙන් මෙම ඔප්පුවේ නියමයන්, ව්‍යතිරේක සහ කොන්දේසි අදාල වියහැකි තාක්කල් එය පිළිපදිමින්, ඉටුකරමින් සහ එයට යටත්ව සිටියහොත්, මෙම කොටසේ නියමයන්ට සහ සීමාවන්ට යටත්ව, පෞද්ගලික නියෝජිතයන් හානිපූරණය කරනු ඇත.

5. මෙම කොටස යටතේ වන්දි ගෙවීමේ විෂයය වියහැකි යම් මරණයක් සම්බන්ධයෙන් පවත්වනු ලබන යම් හදිසි මරණ පරීක්ෂණයකදී සමාගමට එහි අභිමතය පරිදි නියෝජිතයන් නියම කරගතහැකි අතර, මෙම කොටස යටතේ වන්දි ගෙවීමේ විෂයයක් වියහැකි යම් සිද්ධියක් හේතුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් වූ යම් ක්‍රියාවක් හෝ සිදුවී ඇතැයි කියනු ලබන වැරැද්දක් සම්බන්ධයෙන් යම් මහේස්ත්‍රාත් අධිකරණයකදී හෝ ප්‍රථම අවස්ථා උසාවියකදී හෝ පවත්වනු ලබන නඩුවකදී විත්තිය භාරගත හැකිය.

**වගකීමෙහි සීමාවන්**
**මෝටර් සයිකල්**

2 (ආ) කොටස යටතේ සමාගමේ වගකීමෙහි සීමාව
1. (අ) සීමාරහිතයි
2 (ආ) කොටස යටතේ සමාගමේ වගකීමෙහි සීමාව
1. (ආ) රුපියල් 15,000/-
එක් සිද්ධියක් සඳහා ඉදිරිපත් කරනු ලබන යම් එක් හිමිකමක් හෝ හිමිකම් මාලාවක් සම්බන්ධයෙන්

(ඇ) පුද්ගලික කාර් සහ මෝටර් සයිකල් හැර අනෙකුත් සියළුම වාහනවලට අදාළවේ.

1. ඔප්පුවෙහි සඳහන් කර ඇති වගකීම් සීමාවන්ට යටත්ව, පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට රක්ෂිතයා බැඳී සිටින හිමිකම් පාන්නාගේ වියදම් සහ ගාස්තු ඇතුලු සියලුම වියදම් සමාගම විසින් රක්ෂිතයා හානිපූරණය කරනු ලැබේ:

   (i) මෙහි උපලේඛනයේ / උපලේඛනවල විස්තර කර ඇති යම් වාහනයක් හේතුවෙන් හෝ ඒ මගින් හෝ එය පාවිච්චි කිරීමෙන් (එම වාහන පැටවීම සහ බෑම ඇතුළුව) යම් පුද්ගලයකුට සිදුවන මරණය හෝ ශාරීරික තුවාල.

   (ii) මෙහි උපලේඛනයේ / උපලේඛනවල විස්තර කර ඇති යම් වාහනයක් පාවිච්චි කිරීමෙන් (එම වාහන පැටවීම සහ බෑම ඇතුළුව) දේපලවලට සිදුවන හානිය.

පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සමාගම වගකියනු නොලැබේ:

   (අ) එම වාහනවලට පැටවීම සඳහා බඩු තොග රැගෙන ඒම හෝ එම වාහනවලින් බෑමෙන් අනතුරුව ඉවත් කිරීම හා සම්බන්ධ රියමග හෝ ප්‍රසිද්ධ පාරවල සීමාවන් අභිබවා යාම හේතුවෙන් හෝ ඒ මගින් සිදුවන මරණය, තුවාල හෝ හානිය:
   (ආ) රක්ෂිතයා යටතේ සේවය කරමින් සිටියදී එම රැකියාව හේතුවෙන් යම් පුද්ගලයකුට සිදුවන මරණය හෝ ශාරීරික තුවාල:
   (ඇ) එම වාහනය තුල හෝ ඒ මත රැගෙන යනු ලබන හෝ හිමිකමක් ඉදිරිපත් කළහැකි සිදුවීම ඇතිවන අවස්ථාවේදී එම වාහනයට නැගීම හෝ ඉන් බැසීමේදී යම් පුද්ගලයකුට (රැකියා ගිවිසුමක් හේතුවෙන් රැගෙන යනු ලබන පුද්ගලයකු හැර) සිදුවන මරණය හෝ ශාරීරික තුවාල:
   (ඈ) රක්ෂිතයාගේ හෝ රක්ෂිතයාගේ පවුලේ සාමාජිකයකුගේ භාරයේ හෝ රැකවරණයේ හෝ පාලනයේ තිබෙන්නාවූ හෝ එම වාහන මගින් රැගෙන යනු ලබන දේපළවලට සිදුවන හානිය:
   (ඉ) යම් පාලමකට සහ / හෝ කිරන පාලමකට සහ / හෝ බෝක්කු පාරකට සහ / හෝ යම් පාරකට සහ / හෝ ඒ යට තිබෙන යම් දෙයකට අදාළ වාහනයේ රැගෙන යනු ලබන බර තොගය හේතුවෙන් හෝ එහි දෙදරීම හේතුවෙන් සිදුවන යම් හානිය:
   (ඊ) එම වාහනයෙන් පිටවන ගිනිපුපුරු හෝ අළු හෝ එම වාහනයේ ඇති බොයිලේරුවක් පිපිරීම හේතුවෙන් සිදුවන දේපළ හානි:
   (උ) එම වාහනයේ බොයිලේරුවක් පිපිරීම හේතුවෙන් හෝ ඒ මගින් සිදුවන මරණය හෝ ශාරීරික තුවාල: එම මරණය හෝ තුවාල මෙහි උපලේඛනයේ විස්තර කර ඇති මහාමාර්ගයක එම වාහනය ධාවනය කිරීම හේතුවෙන් හෝ ඒ මගින් සිදුවී තිබුණහොත් මෙම බැහැරකිරීම අදාළ නොවේ.

2. සමාගමෙහි ලිඛිත අනුමැතිය සහිතව දරන ලද සියළුම වියදම් සමාගම විසින් ගෙවනු ලැබේ.

3. මෙම කොටස මගින් ප්‍රදානය කරඇති රක්ෂිතයා හානිපූරණය කිරීමේ සීමාවට යටත්ව සහ ඒ අනුව සමාගම විසින් එම වාහනය පදවන යම් පුද්ගලයකුට ඔහු / ඇය පහත සඳහන් කරුණු ඉටුකර ඇතොත් හානිපූරණය කරනු ඇත:

   (අ) ඔහු / ඇය වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් යටතේ හානිපූරණය කරගැනීම සඳහා අයිතිවාසිකම් නොමැත්තෙකු විය යුතුය.

   (ආ) ඔහු / ඇය රක්ෂිතයා මෙන් මෙම ඔප්පුවේ නියමයන්ට, ව්‍යතිරේකවලට සහ කොන්දේසිවලට යටත්ව, එය අදාලවනතෙක් එයට එකඟවී එය පිළිපැදිය යුතුය.

4. මෙම කොටස යටතේ වන්දි ලබාගැනීමට අයිතියක් ඇති යම් පුද්ගලයෙක් මරණයට පත්වුවහොත් එම පුද්ගලයා විසින් දරනලද වගකීම් සම්බන්ධයෙන් ඔහුගේ / ඇයගේ පෞද්ගලික නියෝජිතයින්ට, ඔවුන් රක්ෂිතයා මෙන් මෙම ඔප්පුවේ නියමයන්, ව්‍යතිරේක සහ කොන්දේසි අදාල වියහැකි තාක්කල් එය පිළිපදිමින්, ඉටුකරමින් සහ එයට

යටත්ව සිටියහොත්, මෙම කොටසේ නියමයන්ට සහ සීමාවන්ට යටත්ව, පෞද්ගලික නියෝජිතයන් හානිපූරණය කරනු ඇත.

5. මෙම කොටස යටතේ වන්දි ගෙවීමේ විෂයය වියහැකි යම් මරණයක් සම්බන්ධයෙන් පවත්වනු ලබන යම් හදිසි මරණ පරීක්ෂණයකදී සමාගමට එහි අභිමතය පරිදි නියෝජිතයන් නියම කරගතහැකි අතර, මෙම කොටස යටතේ වන්දි ගෙවීමේ විෂයයක් වියහැකි යම් සිද්ධියක් හේතුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් වූ යම් ක්‍රියාවක් හෝ සිදුවී ඇතැයි කියනු ලබන වැරැද්දක් සම්බන්ධයෙන් යම් මහේස්ත්‍රාත් අධිකරණයකදී හෝ ප්‍රථම අවස්ථා උසාවියකදී හෝ පවත්වනු ලබන නඩුවකදී විත්තිය ආරක්ෂා කිරීමේ ක්‍රියාපටිපාටිය භාරගත හැකිය.

**වගකීම්වල සීමාවන්**

පෞද්ගලික කාර් සහ මෝටර් සයිකල් හැර අනෙකුත් සියලු වාහන

2 (ඈ) කොටස යටතේ සමාගමේ වගකීමෙහි සීමාව

1. (i) සීමාරහිතයි

2 (ඈ) කොටස යටතේ සමාගමේ වගකීමෙහි සීමාව

1. (ii) රුපියල් 15,000/-
එක් සිද්ධියක් සඳහා ඉදිරිපත් කරනු ලබන යම් එක් හිමිකමක් හෝ හිමිකම් මාලාවක් සම්බන්ධයෙන්

## 3 වෙනි කොටස : වෛද්‍ය වියදම්
**(පෞද්ගලික කාර් සඳහා පමණක් අදාලවේ)**

උපලේඛනයේ දක්වා ඇති වාහනයක ගමන් කරන වැටුප් ලබන රියදුරකු සහ / හෝ සහායකයකු සහ / හෝ පිරිසිදු කරන්නකු හැර රක්ෂිතයා හෝ වෙන යම්කිසිවකු එම වාහනයට සිදුවූ හදිසි අනතුරෙහි සෘජු ප්‍රතිඵලයක් වශයෙන් සාහසික, හදිසි අනතුරුමය, බාහිර දෘෂ්‍යමාන හේතුවක් මගින් ඇතිවන යම් ශාරීරික තුවාල සම්බන්ධව දරනලද සාධාරණ වෛද්‍ය වියදම් වෙනුවෙන් යම් එක් හදිසි අනතුරක් වෙනුවෙන් මෙම වගන්තිය යටතේ සමාගමේ පූර්ණ වගකීම රුපියල් 1,500/- ට සීමාකර සමාගම විසින් රක්ෂිතයාට මුදල් ගෙවනු ලැබේ.

## සමහර නියමයන් සහ අයකරවාගැනීමේ අයිතිය ඉවත්කිරීම

1951 අංක 14 දරන මෝටර් රථවාහන පනතේ 102 සහ 105 වෙනි වගන්තිවල විධිවිධාන යටතේ හෝ ඒ මගින් පවරා ඇති බලතල අනුව, යම් මුදලක් අයකරගැනීම සඳහා මෙම ඔප්පුව මගින් වන්දි මුදල් ලබාදී ඇති යම් පුද්ගලයකුට හෝ වෙනත් යම් පුද්ගලයකුට තිබෙන අයිතිය මෙම ඔප්පුවේ හෝ එහි අඩංගු යම් වගන්තියක අඩංගු කිසිවක් බලපෑමක් එල්ල නොකරනු ඇත.

එහෙත් ඉහත කී විධිවිධාන හැර සමාගම විසින් ගෙවා ඇති එහෙත් සමාගම ගෙවීමට බැඳී නොමැති සියළුම මුදල් රක්ෂිතයා විසින් සමාගමට ආපසු ගෙවිය යුතුය.

## හානිපූරණ සීමා අදාලත්වය
**(පෞද්ගලික කාර් සහ මෝටර් සයිකල් හැර අනෙකුත් සියලු වාහන)**

එක් පුද්ගලයකුට වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් හානිපූරණය කළයුතුවන හදිසි අනතුරකදී මෙම ඔප්පුවේ නියමයන් මගින් සහ / හෝ යම් හානිපූරණයක් පිළිබඳව මෙහි සඳහන් යම් වගන්තියක් මගින් පනවා ඇති යම් සීමාවන්, හානිපූරණය කරනලද සියළුම පුද්ගලයින් සඳහා එසේ හානිපූරණය කරනලද මුළු මුදලටම අදාළවන අතර, එම හානිපූරණය රක්ෂිතයාට ප්‍රමුඛත්වයක් දෙමින් අදාළවේ.

## පොදු බැහැරකිරීම්
**(සියළුම වාහන සඳහා අදාළවේ)**

පහත සඳහන් අවස්ථා සම්බන්ධයෙන් මෙම ඔප්පුව යටතේ සමාගම වගකීමට බැඳී නොමැත:

(1) සිදුවී පැය 24ක් ඇතුලත සමාගමට දැනුම් දීමට අපොහොසත් වූ යම් හදිසි අනතුරක්, අලාභයක්, හානියක් සහ/හෝ ඇතිවූ වගකීමක් ඉටුකරනලද වගකීමක්.

(2) ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයෙන් පිටතදී ඇතිවූ හදිසි අනතුරුමය අලාභයක්, හානියක් සහ / හෝ එමගින් ඇතිවූ හෝ භාරගන්නා ලද හෝ දරනලද වගකීමක්

(3) ගිවිසුමක් නිසා එකහවූ යම් වගකීමක්, එහෙත් එවන් ගිවිසුමක් නොමැති අවස්ථාවකදී එවන් වගකීමක් එකතු නොවේ.

(4) මෙම ඔප්පුව යටතේ රක්ෂණය කර ඇති යම් මෝටර් රථවාහනයක් පහත සඳහන් කාරණා වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් යොදාගෙන ඇති අවස්ථාවකදී ඇතිවූ යම් හදිසි අනතුරුමය අලාභයක්, හානියක් සහ / හෝ එමගින් ඇතිවූ හෝ භාරගන්නා ලද හෝ දරන ලද වගකීමක්:

(අ) වර්තමාන රක්ෂණ සහතිකය මගින් අනුමත නොකළ යම් අරමුණක් සඳහා පාවිච්චි කරමින් තිබියදී

(ආ) වර්තමාන රක්ෂණ සහතිකය මගින් අවසර ලබාදී නොමැති යම් පුද්ගලයෙක් විසින් එය ධාවනය කරමින් තිබියදී

(5) පහත සඳහන්කර ඇති යම් දෙයක සෘජුව හෝ අනියම් හේතුවක් මගින්, ආසන්න හෝ දුරස්ථව ඇතිවූ හෝ දායකවූ හෝ සොයාගත හැකිවූ හෝ සිදුවූ යම් හදිසි අනතුරු හානියක්, අලාභයක් හෝ වගකීමක් (නීතිමය අවශ්‍යතාවන් සපුරාලීමට එය අවශ්‍යවන තාක්කල්):

(අ) යුද්ධය, ආක්‍රමණය, විදෙස් සතුරු ක්‍රියා, ඒදිරිවාදිකම් හෝ යුද්ධය බඳු මෙහෙයුම් (යුද්ධයක් ප්‍රකාශකර තිබුණත් නැතත්) සිවිල් යුද්ධය, කැරැල්ල, විප්ලව, හමුදා කුමන්ත්‍රණ, බලය පැහැරගැනීම්

(ආ) වැඩවර්ජන, කැරළි කෝලාහළ සහ මහජන කැළඹීම්

(ඇ) රඳවා තබාගැනීම්, අත්පත්කරගැනීම්, රාජසන්තක කිරීම් හෝ යම් තර්ජන තැත

(ඈ) ජලගැලීම්, ටයිෆූනය, හරිකේන් කුණාටු, ටෝනාඩෝ සුළිසුලං, ගිනිකඳු පිපිරීම්, භූමිකම්පා හෝ අනෙකුත් ස්වභාවික විපත් හෝ ඉහත සඳහන් කර ඇති යම් සිද්ධියක සෘජු ප්‍රතිඵල

තවද, මේ යටතේ යම් හිමිකමක් ඉදිරිපත් කරනු ලැබුවහොත් වන්දි ඉල්ලා සිටින පුද්ගලයා අදාල හදිසි අනතුරු අලාභ හෝ හානිය හෝ වගකීම ඉහත සඳහන් කර ඇති යම් සිද්ධියක් මගින් ඇති නොවූ බවත් එය දායකවී නොමැති බවත් ඔප්පුකළ යුතුය. එසේ ඔප්පු කිරීමට අපොහොසත් වුවහොත් එම හිමිකම සම්බන්ධයෙන් කිසිම ගෙවීමක් කිරීමට සමාගම බැඳී නොමැත.

(6) රක්ෂිතයා මත්පැන් හෝ යම් මත් ද්‍රව්‍යයක් පාවිච්චි කර මෝටර් රථ වාහනය ධාවනය කරමින් සිටියදී හෝ වෙනත් යම් පුද්ගලයෙක් මත්පැන් හෝ යම් මත්ද්‍රව්‍යයක් පාවිච්චි කර එම මෝටර් රථ වාහනය ධාවනය කරමින් තිබියදී ඒ හේතුවෙන් සෘජුව හෝ වක්‍රව ඇතිවූ යම් හදිසි අනතුරුමය හානි හෝ අලාභය.

(7) (අ) ඕනෑම දේපළකට සිදුවන යම් හදිසි අනතුරු අලාභ හෝ හානිය හෝ ඒ මගින් සිදුවන්නාවූ හෝ එහි අනුශාංගික හානි

(ආ) අයනීකරණය, විකිරණ, යම් න්‍යෂ්ටික ඉන්ධන මගින් ඇතිවන විකිරණ අපවිත්‍රවීම් හෝ විකිරණශීලීතා අපවිත්‍රවීම් හෝ න්‍යෂ්ටික ඉන්ධන දහනයවීම මගින් ඇතිවන යම් න්‍යෂ්ටික අපවිත්‍රවීම්. මෙම බැහැර කිරීමෙහි අරමුණ සඳහා දහනයවීම යටතේ න්‍යෂ්ටික පිපිරීම්ද ඇතුලත්වේ.

## කොන්දේසි

1. ඔප්පුව, උපලේඛනය සහ මෝටර් රථ රක්ෂණයෙහි වර්තමාන සහතිකය යන සියල්ල එකම ගිවිසුමක් වශයෙන් සලකා කියවිය යුතු අතර එහි කිසියම් ස්ථානයක යම් වචනයක් හෝ යෙදුමක් විශේෂ අරුතක් යටතේ යොදා ඇත්නම් එම වචනය හෝ යෙදුම පාවිච්චි කර ඇති සෑම ස්ථානයකදීම ඒ අර්ථයම ගනු ඇත.

2. යම් හදිසි අනතුරක් හෝ හානියක් හෝ අලාභයක් සිදුවුවහොත් සහ යම් හිමිකමක් සම්බන්ධයෙන් වහාම සමාගමට ලිඛිත දැනුම්දීමක් කළ යුතුය. රක්ෂිතයාට ලැබෙන සියලුම ලිපි හිමිකම් පිළිබඳ රිට් ආඥා, සිතාසි සහ / හෝ කැඳවීම් නියෝග එය ලද වහාම සමාගම වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ඔප්පුව යටතේ හිමිකම්පෑමක් ඉදිරිපත් කළ හැකි යම් සිදුවීමක් සම්බන්ධයෙන් යම්

නඩුවක් පැවරීමට ආසන්න බව රක්ෂිතයා දැනසිටී නම් ඒ පිළිබඳවද සමාගමට ලිඛිත දැන්වීමක් කළ යුතුය. මෙම ඔප්පුව යටතේ හිමිකම් පෑමක් ඉදිරිපත්කළ හැකි සොරකමක් හෝ වෙනත් සාපරාධී ක්‍රියාවක් සිදුවුවහොත් රක්ෂිතයා ඒ පිළිබඳ වහාම පොලීසියට දැන්විය යුතු අතර වැරදිකරුට දඬුවම් ලබාදීමේ ක්‍රියාවලියේදී සහයෝගය දැක්විය යුතුය.

3. හදිසි අනතුරක් හෝ හානියක් හෝ අලාභයක් සිදුවී දින 14 ක් ඇතුලත රක්ෂිතයා විසින් සමාගමට සම්පූර්ණ කරනලද හිමිකම් පෝරමය ඉදිරිපත් කළ යුතු අතර, එම හදිසි අනතුර හෝ හානිය හෝ අලාභය සම්බන්ධ අනෙකුත් ලියවිලි දින 30 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය.

4. (අ) සමාගමේ ලිඛිත එකඟතාවයකින් තොරව රක්ෂිතයා විසින් හෝ රක්ෂිතයා වෙනුවෙන් කිසිම ප්‍රතිඥාවක්, පොරොන්දුවක්, ගෙවීමක් හෝ හානිපූරණයක් භාරගැනීම හෝ ලබාදීම නොකළ යුතුය. රක්ෂිතයාගේ නමින් විත්තියක් හෝ හිමිකම් නිරාකරණය කිරීමක් භාරගැනීමට සහ හැසිරවීමට හෝ සමාගමේ යහපත උදෙසා යම් හානිපූරණයක් හෝ හානියක් වෙනත් අරමුණක් සඳහා වන යම් හිමිකමක් වෙනුවෙන් රක්ෂිතයාගේ නමින් නීතිමය පියවරක් ගැනීමට කැමැත්තේනම්, එසේ කිරීමේ අයිතිය තිබෙන්නේ සමාගමට පමණක් වන අතර යම් නඩුවක් ගොනුකිරීමේ හෝ යම් හිමිකමක් නිරාකරණය කිරීමේ පරම අභිමතය සමාගම සතුවේ. මේ සම්බන්ධයෙන් සමාගමට අවශ්‍ය කෙරෙන සියලුම තොරතුරු සහ සහයෝගය රක්ෂිතයා සමාගමට ලබාදිය යුතුය.

(ආ) මෙම ඔප්පුවේ මෝටර් සයිකලයක් නම් 2 (ආ) වෙනි කොටසේ 1 (ආ) හෝ පුද්ගලික කාර් හෝ මෝටර් සයිකල් නොවන මෝටර් වාහනයක් නම් 2 (ඇ) වෙනි කොටසේ 1 (ii) වෙනි උප කොටස යටතේ හිමිකමක් හෝ හිමිකම් මාලාවක් ඉදිරිපත් කළ හැකි යම් සිද්ධියක් ඇතිවීමෙන් අනතුරුව ඕනෑම අවස්ථාවකදී එම උප කොටස යටතේ සඳහන් සමාගමේ වගකීමේ සම්පූර්ණ මුදලම සමාගම රක්ෂිතයාට ගෙවා යම් විත්තියක් හෝ නිරාකරණය කිරීමක් හෝ නීතිමය කටයුත්තක් පවත්වාගෙන යාම අතහැර දැමියහැකි අතර එකී නඩුවක් හෝ විත්ති නිරාකරණයක් හෝ උසාවි කටයුත්තක් සමාගම විසින් අතහැර දැමීමේ අනුෂාංගයක් වශයෙන් හෝ එකී හැසිරවීමක් සමාගම විසින් අතහැර දැමීම හේතුවෙන් රක්ෂිතයාට වී ඇතැයි කියනු ලබන යම් හානියක් වෙනුවෙන් සමාගම වගකියනු නොලැබේ. එමෙන්ම සමාගම එසේ හැසිරවීමක් අතහැර දැමීමෙන් අනතුරුව රක්ෂිතයා විසින් හෝ වෙනත් හිමිකම් ඉදිරිපත් කරන්නකු විසින් දරන ලද යම් නඩු ගාස්තු හෝ වියදම් සම්බන්ධයෙන් ද සමාගම වගකියනු නොලැබේ.

5. සමාගම තම පෞද්ගලික මනාපය පරිදි මෙම උපලේඛනයේ විස්තර කර ඇති යම් මෝටර් රථ වාහනයක් හෝ එහි කොටසක් සහ / හෝ එහි උපාංගයක් හෝ අමතර කොටසක් අලුත්වැඩියා කිරීමට, පුනස්ථාපනය කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට හෝ අලාභයේ හෝ හානියේ ප්‍රමාණය මුදල්වලින් ගෙවීම සඳහා යොමුවිය හැකිය. එවිට සමාගමේ වගකීමෙහි ප්‍රමාණය කුමන හේතුවක් මත වුවද, හානියට පත් හෝ විනාශයට පත් කොටසේ සත්‍ය මිල ගණන සහ එය සවිකිරීමට යන සත්‍ය වියදම නොඉක්මවන අතර එකී උපලේඛනයේ විස්තර කර ඇති (උපාංග සහ අමතර කොටස්ද ඇතුලුව) එම වාහනය පිළිබඳව රක්ෂිතයා තක්සේරු කර ඇති මිල හෝ අලාභය හෝ හානිය ඇතිවන අවස්ථාවේදී (උපාංග සහ අමතර කොටස්ද ඇතුලුව) එකී වාහනයේ මිල යන දෙකෙන් අඩුම ප්‍රමාණය නොඉක්මවනු ඇත. මෝටර් රථ වාහනයට සහ / හෝ එහි උපාංගවලට හානියක් හෝ අලාභයක් ඇතිවීමෙන් අනතුරුව එම වාහනය සඳහා ශ්‍රී ලංකාව තුලදී සපයාගත නොහැකි යම් වාහන අමතර කොටසක් ලබාගැනීමට අවශ්‍යවුවහොත් හෝ අලාභයේ හෝ හානියේ ප්‍රමාණය මුදල්වලින් ගෙවීමේ විකල්පය යොදාගැනීමට සමාගම ඉදිරිපත් වුවහොත් එකී යම් වාහන කොටස් සඳහා සමාගමේ වගකීම පහත සඳහන් සීමාවන්ට යටත්වනු ඇත.

(අ)(i) නිෂ්පාදන සමාගම විසින් හෝ ශ්‍රී ලංකාවේ එම සමාගමේ නියෝජිතයා විසින් නිකුත්කර ඇති අලුත්ම මිල දර්ශනය හෝ මිල ලැයිස්තුවේ සඳහන් මිල, හෝ

(ii) එවන් මිල දර්ශනයක් හෝ මිල ලැයිස්තුවක් නොමැතිනම්, නිෂ්පාදිත සමාගමෙන් ලබාගත් මිල දර්ශනය සහ ගුවන් මගින් හැර වෙනත් ආකාරයකින් එය ගෙන්වා ගැනීමට යන වියදම සහ ඊට අදාළ ආනයනික බද්ද

(ආ) එම කොටස සවිකිරීමට යන සාධාරණ වියදම

6. මෙම උපලේඛනයේ විස්තර කර ඇති යම් මෝටර් රථ වාහනයකට හානියක් හෝ අලාභයක් සිදුවීම වැළැක්වීමට සහ එය මහාමාර්ගයේ ධාවනය වීමට සුදුසු කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වාගැනීමට අවශ්‍ය සාධාරණ සියලුම පූර්වාරක්ෂක පියවර රක්ෂිතයා විසින් ගතයුතු අතර, ඕනෑම අවස්ථාවකදී එකී මෝටර් රථ වාහනය හෝ එහි යම් කොටසක් හෝ රක්ෂිතයාගේ යම් රියදුරෙක් හෝ සේවකයෙක් පරීක්ෂා කිරීම සඳහා වුවද සමාගමට නිදහස් සහ සම්පූර්ණ හැකියාවක් තිබිය යුතුය. හදිසි අනතුරක් හෝ යම් ආපදාවක් ඇතිවුවහොත් එම වාහනයට තවදුරටත් හානියක් හෝ අලාභයක් සිදුවීම වළක්වා ගැනීමට අවශ්‍ය පූර්වාරක්ෂක පියවර නොගෙන එය අනාරක්ෂිතව තබා ඉවත්ව නොයායුතු අතර අවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකිරීමට පෙර එකී වාහනය ධාවනය කිරීමෙන් සිදුවී ඇති හානිය තවත් දරුණු වුවහොත් හෝ එකී වාහනයට තවදුරටත් යම් හානි සිදුවුවහොත් එහි අවදානම සම්පූර්ණයෙන්ම රක්ෂිතයා මත පැවරේ.

7. රක්ෂිතයාට ඔහුගේ නවතම ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් දින හතක (07) දැනුම්දීමක් කර සමාගමට මෙම ඔප්පුව අවලංගු කළහැකි අතර, එසේ ඔප්පුව අවලංගු කරනු ලැබුවහොත් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලසීමාව සඳහා ප්‍රමාණානුකුල අඩුකිරීමක් කර ගෙවා ඇති වාරික මුදල රක්ෂිතයාට ආපසු ගෙවනු ලැබේ. එසේ නැතහොත් දින හතක (07) දැනුම්දීමක් කර ඕනෑම අවස්ථාවකදී රක්ෂිතයාට ඔප්පුව අවලංගු කළහැකි අතර, (වර්තමාන රක්ෂිත කාලයතුල කිසියම් හිමිකම්පෑමක් ඉදිරිපත් කර නොතිබීමට යටත්ව) ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලසීමාව සඳහා සමාගමේ කෙටිකාලීන මිල ගණන යටතේ අදාල වාරික මුදල අඩු කිරීමෙන් අනතුරුව ඉතිරි වාරික මුදල ආපසු ලබාගැනීමට රක්ෂිතයාට අයිතියක් ඇත.

8. (අ) මෙම ඔප්පුවේ පුද්ගලික කාර් නම් 2 (අ) වෙනි කොටසේ 3 (අ) හෝ පුද්ගලික කාර් හෝ මෝටර් සයිකල් නොවන මෝටර් වාහනයක් නම් 2 (අ) වෙනි කොටසේ 2 (ඇ) වෙනි උප කොටස යටතේ නිදහස් කර තිබිය හැකි මෙම කොන්දේසිය වෙනුවෙන් හැර, සමාගම වෙත යම් වගකීමක් මෙම කොන්දේසිය මගින් පවරා නොතිබීමට යටත්ව, මෙම ඔප්පුව යටතේ යම් හිමිකම්පෑමක් ඉදිරිපත් කරන අවස්ථාවකදී එම අලාභය, හානිය හෝ වගකීම ආවරණය කරන වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් ක්‍රියාත්මකව පැවතුනහොත් යම් හානියක, අලාභයක, වන්දියක, නඩු ගාස්තුවක හෝ වියදමක සමානුපාතික කොටසකට වඩා වැඩි ප්‍රමාණයක් ගෙවීමට හෝ දායකවීමට සමාගම බැඳී නොමැත.

(ආ) මෙම ඔප්පුව යටතේ යම් හිමිකම්පෑමක් ඉදිරිපත් කරන අවස්ථාවකදී එම අලාභය, හානිය හෝ වගකීම ආවරණය කරන වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් ක්‍රියාත්මකව පැවතුනහොත් යම් හානියක, අලාභයක, වන්දියක, නඩු ගාස්තුවක හෝ වියදමක සමානුපාතික කොටසකට වඩා වැඩි ප්‍රමාණයක් ගෙවීමට හෝ දායකවීමට සමාගම බැඳී නොමැත. (මෝටර් සයිකල් සඳහා අදාලවේ)

9. බේරුම්කිරීම

මෙම ඔප්පුව යටතේ යම් මතභේදයක් හටගත්තේනම්, (වගකීම භාරගෙන තිබියදී) එකී මතභේදය නිරවුල් කිරීම සඳහා එය බේරුම්කරුවකු වෙත යොමුකළ යුත්තේය.

(i) එකිනෙකට වෙනස් මත දරන පාර්ශවකරුවන් විසින් ලිඛිතව බේරුම්කරුවකු පත්කළ යුතුය. තනි බේරුම්කරුවකු කෙරෙහි ඔවුන්ට එකඟවිය නොහැකිනම් බේරුම්කරුවන් වශයෙන් අපක්ෂපාතී පුද්ගලයන් දෙදෙනකුගේ තීරණය සඳහා එම මතභේදය යොමුකරනු ලැබිය යුතු අතර, ඉන් එක් බේරුම්කරුවකු එක් එක් පාර්ශවය විසින් අනෙක් පාර්ශවයන්ට ලිඛිතව දැනුම්දෙනු ලැබීමෙන් පසුව එක් ලිත් මාසයක් ඇතුලත ලිඛිතව පත්කළ යුතුය. එසේ බේරුම්කරුවකු පත්කරන ලෙස නියම කරමින් ලිඛිතව දැනුම්දී එක් ලිත් මාසයක් ඇතුලත බේරුම්කරුවකු කවර හෝ පාර්ශවයක් විසින් පත්කිරීම ප්‍රතික්ෂේපකර හෝ එසේ පත්කිරීමට අපොහොසත්ව ඇතිවිට තනි බේරුම්කරුවකු පත්කර ගැනීම සඳහා අනෙක් පාර්ශවයට නිදහස ඇත.

(ii) බේරුම්කරුවන් අතර එකඟත්වයක් යළිදු ඇති නොවූ අවස්ථාවක් එළඹියේ නම් ඔවුන්ගේ ප්‍රකාශය කිරීමට මත්තෙන් මතභේදයට තුඩුදුන් කාරණය ඔවුන් විසින් ලිඛිතව පත්කරනු ලබන සභාපතිගේ / විනිශ්චයකරුගේ තීරණය සඳහා යොමුකළ යුතු අතර, එකී සභාපති / විනිශ්චයකරු බේරුම්කරුවන් සමග අසුන්ගෙන ඔවුන්ගේ රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. සභාපති / විනිශ්චයකරු විසින් දෙනු ලබන තීන්දුව සමාගමට එරෙහිව ගනු ලබන යම් නෛතික ක්‍රියාමාර්ගයට පූර්ව කොන්දේසියක් විය යුත්තේය.

(iii) මෙම රක්ෂණ ඔප්පුව යටතේ යම් හිමිකම්පෑමක් වෙනුවෙන් රක්ෂිතයා සම්බන්ධයෙන් ඇති වගකීම සමාගම විසින් නොපිළිගනු ලැබුවහොත් සහ එම හිමිකම්පෑම පිළිනොගන්නා ලද දින සිට ලිත් මාස දොළහක් (12) ඇතුලත මෙහි අන්තර්ගත විධිවිධාන යටතේ එය නිරාකරණය කරගැනීම සඳහා බේරුම්කරුවකු වෙත යොමුකර නොමැත්තේනම් හිමිකම්පෑම සියලු කාර්යයන් සඳහා අත්හැර දමනු ලැබ ඇතැයි සැලකෙන අතර මේ යටතේ ඉන් අනතුරුව එය ආපසු අයකරගත නොහැක්කේය.

10. රක්ෂිතයා විසින් පිළිපැදිය යුතු සහ සපුරාලිය යුතුව ඇති මෙම ඔප්පුවේ සඳහන් නියමයන්, කොන්දේසි සහ වගන්ති අනුව, එය මේ හා සම්බන්ධවන තාක්කල් රක්ෂිතයා විසින් කටයුතු කිරීම හෝ ඉෂ්ඨ කිරීමද, යෝජනාපත්‍රයේ අඩංගු ප්‍රකාශයන්හි සහ පිළිතුරුවල නිරවද්‍යතාවයද මෙම ඔප්පුව යටතේ කිසියම් ගෙවීමක් පිළිබඳව සමාගමේ වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

11. මෙහි රක්ෂණය කර ඇති වාහනයකට හෝ වාහනවලට ඔප්පුව මගින් රක්ෂණය කර ඇති අලාභය හෝ හානිය එය සිදුවන අවස්ථාවේදී රක්ෂිතයා විසින් ප්‍රකාශකර ඇති තක්සේරු අගය වෙළඳපොළ වටිනාකමට වඩා වැඩිවූවහොත්, ඒ වෙනසේ ප්‍රමාණය සඳහා රක්ෂිතයාම රක්ෂකයා වශයෙන් සලකනු ලබන අතර, අලාභයේ හෝ හානියෙහි ප්‍රමාණානුකූල කොටසක් රක්ෂිතයා භාරගත යුතුය. එකකට වැඩි වාහන සංඛ්‍යාවක් තිබුණහොත් සෑම වාහනයකටම මෙම කොන්දේසිය වෙන් වෙන්ව අදාළවනු ඇත. වාහනයේ වෙළඳපොළ වටිනාකම යනු ඒ හා සමාන වර්ගය, මාදිලිය සහ තත්ත්වයේ වාහනයක වටිනාකම වන බව මෙයින් එකඟත්වයෙන් වටහාගනු ලැබේ.

12. හිමිකමක් කිසියම් ආකාරයකින් වංචා සහගත වූවහොත් හෝ මෙම ඔප්පුව යටතේ යම් ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා රක්ෂිතයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාත්මක වන කිසියම් පුද්ගලයෙක් වංචනික ක්‍රියාමාර්ගයක්, උපක්‍රමයක් හෝ ලිපිලේඛන යොදා ගෙන තිබුණහොත් හෝ යම් අලාභයක් හෝ හානියක් රක්ෂිතයා හිතාමතා සිදුකළ ක්‍රියාවක් නිසා හෝ රක්ෂිතයාගේ අනුදැනුම මත සිදුවී තිබුණහොත් මෙම ඔප්පුව යටතේ ලබාදී ඇති සියලු ප්‍රතිලාභ අහිමි කරනු ලැබේ.

**පහත සඳහන් වගන්ති මෙම ඔප්පුවේ උපලේඛනයේ සඳහන් කර ඇත්නම් මෙම ඔප්පුවට සංයුක්ත වී ඇතැයි සලකනු ලබන බවට මෙයින් එකඟත්වයෙන් වටහාගත යුතුය. ඔප්පුවේ සියලුම නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේකයන් වෙනස් ආකාරයට සඳහන් කර ඇත්තේනම් මිස මෙයට අදාලවනු ඇත.**

### 1 වෙනි වගන්තිය - තෙවන පාර්ශවය පමණයි

මෙම ඔප්පුවේ 1 වෙනි සහ 3 වෙනි කොටස (සහ එහි ව්‍යතිරේකයන්) අවලංගු කර ඇති බව මෙයින් එකඟත්වයෙන් වටහාගනු ලැබේ.

ඔප්පුවේ 5 වෙනි වගන්තියේ සඳහන් මුද්‍රිත වචන යෙදුම්ද අවලංගු කර පහත සඳහන් නව කොන්දේසි ආදේශනය කර ඇති බව තවදුරටත් මෙයින් එකඟත්වයෙන් වටහාගනු ලැබේ.

"5 මෝටර් රථවාහනය කාර්යක්ෂම, මාර්ගයේ පැදවිය හැකි තත්ත්වයේ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලුම සාධාරණ පියවර රක්ෂිතයා විසින් ගනු ලැබිය යුතු අතර මෝටර් රථ වාහනය හෝ එහි යම් කොටසක් හෝ රක්ෂිතයාගේ යම් රියදුරකු හෝ සේවකයකු පරීක්ෂා කිරීම සඳහා සමාගමට හැකියාව තිබිය යුතුය."

### 2 වෙනි වගන්තිය - තෙවන පාර්ශව ගිනි සහ සොරකම්

මෙම ඔප්පුවේ පළමුවෙනි කොටසේ සඳහන් කිසිවකට පටහැනි නොවූවද මෙයින් එකඟත්වයෙන් වටහාගනු ලබන්නේ ගිනි, බාහිර ගිනිගැනීම්, ස්වයං ගිනිගැනීම් හෝ අකුණුසැර හෝ මංකොල්ලය, ගෙවල් බිඳීම් හේතුවෙන් ඇතිවන්නාවූ අලාභය හෝ හානිය හැර මේ යටතේ සමාගම බැඳී නොමැති බවයි. තවද මෙම ඔප්පුවේ 3 වෙනි කොටස අවලංගු කර ඇති බවද මෙයින් එකඟත්වයෙන් වටහාගනු ලැබේ.

### 3 වෙනි වගන්තිය - කුලී සින්නක්කර / කල්බදු

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන (මෙහි මින්මතුවට "අයිතිකරු" යැයි සඳහන් කරනු ලබන) උපලේඛනයේ සඳහන් කර ඇති ආයතනය, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති වාහනයේ අයිතිකරුවන් වන අතර, එකී වාහනය වූ කලී එක් පාර්ශවයට අයිතිකරුවන්ද අනෙක් පාර්ශවයට රක්ෂිතයාද අතරේ ඇතිකරගන්නා ලද කුලී සින්නක්කර / බදු ගිවිසුමක විෂය කාරණය වන බවට මෙයින් තේරුම්ගෙන එකඟවන අතර, එකී අයිතිකරුවන් මෙම වගන්තිය නොවන්නට මෙම පනත යටතේ එකී වාහනයට සිදුවූ (අලුත්වැඩියා කිරීමෙන්, යථා තත්ත්වයට පත්කිරීමෙන්, ප්‍රතිසම්පාදනය කිරීමෙන් පිරිමසාලනු නොලැබූ අලාභය හෝ හානිය) අලාභය හෝ හානිය සම්බන්ධයෙන් මෙම ඔප්පුව යටතේ රක්ෂිතයාට ගෙවිය යුතු මුදල් ඇතොත්, ඒ සම්බන්ධයෙන් එකී අයිතිකරුවන්, උනන්දුවක් දක්වන බවට තවදුරටත් තේරුම්ගෙන එකඟවන අතර, එකී අයිතිකරුවන් වාහනයේ අයිතිකරුවන් වන තාක්කල්, එම මුදල් එකී අයිතිකරුවන්ට ගෙවිය යුතු අතර එම මුදල් ලැබීම, එම අලාභය හෝ හානිය සම්බන්ධයෙන් සමාගමෙහි වගකීම පූර්ණ වශයෙන් සහ අවසාන වශයෙන් ගෙවා නිමකර ඇති බවට සාක්ෂියක් වන්නේය.

මෙම වගන්තිය මගින් ප්‍රකාශිතවම එකඟවූ ආකාරයට හැර මෙහි ඇතුලත් කිසිවකින් මෙම ඔප්පුව හෝ එහි අඩංගු කොන්දේසියක් හෝ නියමයක් යටතේ හෝ ඒ හා සම්බන්ධ රක්ෂිතයාගේ අයිතීන් හෝ සමාගමේ වගකීම් වෙනස් කිරීම හෝ ඊට බලපෑම් කිරීම නොකළ යුත්තේය.

### 4 වෙනි වගන්තිය - ස්වෙච්ඡා අතිරික්තය - සියළු හිමිකම්

මෙම ඔප්පුවේ 1 වෙන සහ 2 වෙනි වගන්තිවලට පටහැනිව කුමක් සඳහන් වූවද, එක් එක් සහ හැම සිද්ධියක් සම්බන්ධයෙන්ම, රක්ෂිතයා, උපලේඛනයේ නිශ්චිතව සඳහන් එම මුදල (වියදම් කරනු ලැබිය හැකි වඩා අඩු මුදලක්) එය යටතේ විධිවිධාන සලස්වා ඇති වියදම (පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් ගෙවීම් තිබේනම් ඒවාද ඇතුළුව) සහ මෙම ඔප්පුවේ 4 වෙනි කොන්දේසිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේදී සමාගම විසින් දරන ලද යම් වියදමක් ඇත්නම් එයද සමාගම විසින් දරන ලද වියදමට වගකිව යුතු වන්නේය.

මේ යටතේ රක්ෂිතයා වගකිවයුතු මුදලද ඇතුලත් වූයේ නම්, එම මුදල් ගණන, රක්ෂිතයා විසින් වහාම සමාගම වෙත ගෙවිය යුතුය.

මෙම වගන්තියේ කාර්යයන් සඳහා **සිද්ධිය** යන පාඨයෙන් යම් එක් මෝටර් රථවාහනයක් සම්බන්ධයෙන් හෝ මෙම ඔප්පුව යටතේ හානිපූරණය ලබාදීමට සම්බන්ධවූ හෝ අදාළවූ එක් හේතුවකින් පැන නගින සිද්ධියක් හෝ සිද්ධි මාලාවක් අදහස් විය යුතුය.

### 5 වෙනි වගන්තිය - පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන මෙහි උපලේඛනයේ විස්තර කර ඇති යම් තැනැත්තකු විසින් මෙහි මින්මතු අර්ථ දක්වා ඇති පරිදි මෙහි උපලේඛනයේ විස්තර කර ඇති යම් වාහනයක් තුලට නැගීමේදී, වෙනත් යම් හේතුවකින් ස්වාධීනව වාහනයෙන් බැසීමේදී, වාහනයෙන් ගමන් කිරීමේදී, ප්‍රචණ්ඩ, හදිසි අනතුරු, බාහිර සහ පෙනෙන්නට ඇති මාර්ගයකින් හෝ (එබඳු තුවාලවල ප්‍රතිඵලයක් ලෙස සිදුකරනු ලබන වෛද්‍ය හෝ ශල්‍ය වෛද්‍ය ප්‍රතිකාර හැර) සිදුවන ශාරීරික තුවාල සඳහා එම තුවාලය සිදුවීමෙන් ලිත් මාස තුනක් (03) ඇතුලත මෙහි පහත විධිවිධාන සලස්වා ඇති පරිමාණයට අනුව වන්දි ගෙවීමට සමාගම භාරගන්නා බවට මෙයින් තේරුම්ගෙන එකඟවනු ලැබේ.

**වන්දි ප්‍රමාණය**
(ඔප්පුවේ උපලේඛනයේ දක්වා ඇති රක්ෂිත මුදල මත අදාල වේ)

| | | |
|---|---|---|
| 1. | මරණය | 100% |
| 2. | ඇස් දෙකෙහිම පෙනීම පූර්ණව සහ නැවත ලබාගත නොහැකි ආකාරයට නැතිවී යාම හෝ අත් දෙකම හෝ පාද දෙකම මැණික් කටුවෙන් ඉහළ සහ විලුඹට ඉහළින් හෝ පාද දෙකම හෝ එක් අතක් හෝ එක් පාදයක් ශරීරයෙන් වෙන්වීමෙන් සම්පූර්ණයෙන්ම අහිමිවීම | 100% |
| 3. | එක් අතක් හෝ එක් පාදයක් මැණික් කටුවෙන් ඉහළ සහ විලුඹට ඉහළින් ශරීරයෙන් වෙන්වීමෙන් සම්පූර්ණයෙන්ම අහිමිවීම හෝ එක් ඇසක පෙනීම පූර්ණව සහ නැවත ලබාගත නොහැකි ආකාරයට නැතිවී යාම | 50% |

එසේකුදු වුවද හැම විටම,

(අ) යම් එක් සිදුවීමක් නිසා පැන නගින එබඳු යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන්දි ගෙවිය යුත්තේ, ඉහත (1) සිට (3) දක්වාවූ අයිතමයන්ගෙන් එක් අයිතමයක් යටතේ පමණක් වන අතර, සමාගමේ මුලු වගකීම එකතුව ගත්කළ උපලේඛනයේ සඳහන්කර ඇති වන්දි ප්‍රමාණයේ අයිතමයන් යටතේ ගෙවිය යුතු මුදල නොඉක්මවිය යුතුය.

(ආ) සෘජුව හෝ වක්‍රව හෝ සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් (1) හිතාමතාම සිදුකරගනු ලබන ස්වයං තුවාල, සිය දිවි නසාගැනීම හෝ සිය දිවි නසාගැනීමට තැත්කිරීම, ශාරීරික ඌණතාවක් හෝ බෙලහීනතාවක් හෝ (2) එම තැනැත්තා මත්පැන් හෝ මත්ද්‍රව්‍යවල බලපෑමට යටත්ව සිටින අතර සිදුවන හදිසි අනතුරක් නිසා පැන නගින හෝ එහි ප්‍රතිඵලයක් නිසා ඇතිවන හෝ සම්බන්ධතාවක් ඇතැයි කිවහැකි මරණයක් හෝ තුවාල සම්බන්ධයෙන් කිසිදු වන්දියක් ගෙවනු නොලැබේ.

(ඇ) රක්ෂිතයාගේ අනුමැතිය මත පමණක් එම වන්දිය ගෙවනු ලබන අතර එය සෘජුවම තුවාල ලැබූ තැනැත්තාට හෝ ඔහුගේ නීත්‍යානුකූල බූදල් බලකරුට ගෙවනු ලැබේ. එම තැනැත්තා විසින් එය ලැබුණු බවට කරනු ලබන දැනුම්දීම තුවාල ලත් පුද්ගලයා වෙනුවෙන් සමාගමේ වගකීමෙන් නිදහස්වීමක් වශයෙන් සලකනු ලැබේ.

(ඈ) ලියාපදිංචි කිරීමේ සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති තැනැත්තන් සංඛ්‍යාවට වැඩි නොවන තැනැත්තන් සංඛ්‍යාවක් එම තුවාලය සිදුවන අවස්ථාවේ එකී වාහනය තුල නොසිටිය යුතු අතර මෙය අදාල විය යුත්තේ, මගීන් සම්බන්ධයෙන් ලබාගන්නා ලද ආවරණය සම්බන්ධයෙන් පමණකි.

(ඉ) එම තැනැත්තා එම තුවාලය සිදුවන අවස්ථාවේදී වයස අවුරුදු 16 ට අඩු හෝ අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

(ඊ) මෙම ඔප්පුව යටතේ ඇති වැඩවර්ජන, කැරලි කෝලාහල, මහජන කැළඹීම් සහ ත්‍රස්තවාදය දීර්ඝ කිරීම මෙම වගන්තිය සඳහා ද, විශේෂයෙන් ආවරණය කර නොමැති නම්, එය මෙම වගන්තිය සඳහා අදාල නොවේ.

### 6 වෙනි වගන්තිය - මගී අවදානම
(වාණිජ මගීන් ගෙනයන වාහනවලට අදාල වේ)

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවේ 2 (ඇ) කොටසේ 1 (ii) (ඇ) උප වගන්තියට පටහැනිව සඳහන්වන කිසිවක් නොසලකාම, එසේ වුවද, වෙනත් ආකාරයට, මෙම ඔප්පුවේ සඳහන් වන නියමයන්, ව්‍යතිරේක සහ කොන්දේසිවලට යටත්ව එහි උපලේඛනයේ විස්තර කර ඇති යම් වාහනයක් තුල හෝ ඒ මත ගෙනයනු ලබන හෝ එයට ඇතුල්වන හෝ නගින හෝ එයින් බසින යම් මගියකුට සිදුවන මරණය හෝ ශාරීරික තුවාල සම්බන්ධයෙන් ගෙවීමට ඔහු නෛතිකව යටත්වන හිමිකම් ගාස්තු සහ වියදම් ඇතුලු සියලුම මුදල් ගණන් සම්බන්ධයෙන්, සමාගම රක්ෂිතයා හෝ මෙම ඔප්පුවේ 2 වෙනි වගන්තිය යටතේ හානිපූරණය කරන ලද වෙනත් යම් තැනැත්තකු උපලේඛනයේ සඳහන් සීමාවන්ට යටත්ව, හානිපූරණය කරනු ලබනු ඇත. එසේකුදු වුවද, උපලේඛනයේ සඳහන් කර ඇති ආසන සංඛ්‍යාවට වඩා වැඩි (කොන්දොස්තරවරයකු / සහායකවරයකු සිටීනම් ඔහුට සහ රියදුරුට අමතරව) මගීන් සංඛ්‍යාවක්, එම වාහනයෙහි ගෙනයනු ලබන අවස්ථාවකදී හදිසි අනතුරක් සිදුවන හැම විටකම, එම හදිසි අනතුර සම්බන්ධයෙන්, මෙම වගන්තිය හේතුවෙන් සමාගම විසින් ගෙවිය යුතු මුදලෙන් ප්‍රමාණානුකූල අනුපාතයක්, රක්ෂිතයා විසින් සමාගමට ආපසු ගෙවිය යුතුය.

### 7 වෙනි වගන්තිය - කම්කරු වන්දි රක්ෂණය

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන මෙහි උපලේඛනයේ විස්තර කර ඇති යම් මෝටර් රථවාහනයක උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති, ගෙවීම් ලබන රියදුරු සහ / හෝ සහායක / පිරිසිදු කරන්නා සහ / හෝ කම්කරුවකු (කම්කරුවන්) යන අයගෙන් කෙනෙකුට රක්ෂිතයා සඳහා සේවයේ යෙදී සිටියදී සිදුවන පෞද්ගලික තුවාලයන් සම්බන්ධයෙන්, 1934 කම්කරු වන්දි ආඥා පනතේ සහ මෙම වගන්තිය නිකුත්කළ දිනයට කලින් සම්මත කරන ලද, එම ආඥා පනත සම්බන්ධ තදනන්තර සංශෝධන ප්‍රකාර වන්දි ගෙවීමට සමාගම පොරොන්දු වෙයි.

රක්ෂණ කාලසීමාවක් ඉකුත්වන සෑම අවස්ථාවකදීම, මෙම ඔප්පුවේ උපලේඛනයේ විස්තර කර ඇති වාහන / වාහනයන් සම්බන්ධයෙන්, එම කාලසීමාව තුල යම් එක් අවස්ථාවකදී සේවයේ නියුතු උපරිම රියදුරු (සහ / හෝ සහායක / පිරිසිදු කරන්නා සහ / හෝ කම්කරුවන්) සංඛ්‍යාව පිළිබඳව රක්ෂිතයා සහතික කළයුතු අතර, ඒ අනුව වාරිකය ගලපනු ලැබේ.

එසේකුදු වුවද හැමවිටකම,

(i) යුද්ධයක්, ආක්‍රමණයක්, විදෙස් සතුරු ක්‍රියාවක්, එදිරිවාදිකම් හෝ (යුද්ධය ප්‍රකාශ කරනු ලැබුවද, නොලැබුවද) යුද්ධයක් බඳු මෙහෙයුම්, සිවිල් යුද්ධයක්, හමුදා කැරැල්ලක්, ජන කැළඹීමක්, කැරැල්ලක්, විප්ලවයක්, කුමන්ත්‍රණයක්, යුධ හමුදා හෝ පැහැරගත් බලයක් සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව හෝ ආසන්නව හෝ දුරස්ථව හේතුවූ හෝ දායකවූ හෝ ආරම්භවූ හෝ පැන නැගුනාවූ වගකීමක් සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ රක්ෂිතයා හානිපූරණය කරනු නොලැබේ.

(ii) රක්ෂිතයා, ඔහුගේ සාමාන්‍ය සේවකයන් සඳහා මෙහි විස්තර කර ඇති වගකීම සම්බන්ධයෙන් වෙනත් යම් රක්ෂණ සමාගමක හෝ සමාගම්වල රක්ෂණ ඔප්පු ලබාගෙන තිබේනම් හෝ පසුව ලබාගත්තේ නම් යම් වගකීමක් සම්බන්ධයෙන් මෙම වගන්තියෙන් රක්ෂිතයා හානිපූරණය කරනු නොලැබේ.

(iii) රක්ෂිතයා හදිසි අනතුරු වළක්වා ගැනීම සඳහා සාධාරණ පූර්වාරක්ෂක පියවර ලබාගත යුතු අතර, සියලුම ව්‍යවස්ථාපිත වගකීම් පිළිපැදිය යුතුය.

(iv) රක්ෂිතයා ඔහු ළඟ සේවය කරන සෑම රියදුරන්/ සහායකයින් / පිරිසිදු කරන්නන් හෝ කම්කරුවන්ගේ නම් සහ ඔවුන්ට ගෙවනු ලබන වැටුප්, වේතන හෝ ගෙවනු ලබන අනෙකුත් ගෙවීම් පිළිබඳව වාර්තාවක් තබාගත යුතු අතර, එම ලේඛන පරීක්ෂාකර බැලීම සඳහා සෑම මොහොතකම සමාගමට අවසර ලබාදිය යුතුය.

(v) මෙම වගන්තිය සම්බන්ධයෙන් ගෙවනු ලබන වාරිකය මෙම ඔප්පුවේ හිමිකම් නොපෑමේ ප්‍රතිදාන වගන්තිය යටතේ විධිවිධාන සලස්වන ලද යම් ප්‍රතිදානවල යටත් ගෙවීමක් ලෙස සැලකිය යුතු නොවේ. එකී හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාව සඳහා, ඔප්පුව යටතේ හිමිකමක් වශයෙන් සලකනු නොලැබිය යුතුය.

(vi) රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි ඔප්පුව අවලංගු කරනු ලැබුවහොත්, මෙම වගන්තිය වෙනුවෙන් ගෙවා ඇති කිසිම වාරිකයක් ආපසු ගෙවනු නොලැබේ.

(vii) මෙම වගන්තියේ අරමුණ සඳහා රක්ෂණය කරන ලද වාහනයේ නැංවීම හෝ බැස්සවීමේ අරමුණෙන් රැගෙන යනු ලබන කම්කරුවන් සහායකයන් ලෙස සලකනු නොලැබේ.

(viii) එබඳු වන්දියක් ගෙවිය යුතු වන්නේ රක්ෂිතයාට විරුද්ධව ඇති හිමිකම් පූර්ණ වශයෙන් සපුරාලීම සහ ගෙවා අවසන් කිරීම වශයෙන් පිළිගැනීමට, අවස්ථාවට අදාලවන පරිදි සේවකයා හෝ ඔහුගේ යැපෙන්නන් එකඟවන අවස්ථාවලදී පමණකි. එබඳු එකඟවීමක් ඇතිකර ගැනීමට අසමත්වන

අවස්ථාවකදී සමාගම පොදු නීතිය යටතේ, රක්ෂිතයාගේ නෛතික බැඳීම් සම්බන්ධයෙන්, ඔහු හානිපූරණය කරනු ලබනු ඇති අතර, ඊට අතිරේකව, සමාගමේ ලිඛිත කැමැත්ත ඇතිව දරනලද සියලුම ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. (පෞද්ගලික කාර් සඳහා පමණක් අදාළවේ)

### 8 වෙනි වගන්තිය - ඇදගෙන යාමේ ගාස්තු

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන ඔප්පුවේ 1 වෙනි කොටසේ 4 වෙනි කොටස සම්බන්ධයෙන් ගෙවනු ලබන උපරිම මුදල, මෙම ඔප්පුවේ නියමයන්, ව්‍යතිරේකයන් සහ කොන්දේසිවලට යටත්ව, උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණය දක්වා වැඩිකර ඇත.

### 9 වෙනි වගන්තිය - සුලංවාමුවා / කවුළු වීදුරු බිඳීම්

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන, රක්ෂිත වාහනයේ වාමුවාවේ හෝ කවුළුවල යම් වීදුරුවක්, වාහනයේ සැකිල්ලට වෙනත් යම් හානියක් සිදු නොවන ආකාරයට, බිඳී ගියහොත්, එසේ බිඳී යාමට හේතු නොසලකාම, එම වාමුවාව / කවුලු සහ සීරුණු සැකිල්ල ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තුව වශයෙන් ඔප්පුවේ උපලේඛනයෙහි සඳහන් කර ඇති මුදලට නොවැඩි මුදලක්, යම් එක් සිද්ධියක් සඳහා සමාගම විසින් ගෙවනු ලැබේ. එපමණක්ද නොව, එබඳු ගෙවීමක් කරනු ලබන්නේ, එසේ නොවන්නට ලැබිය යුතු කිසියම් හිමිකම් නොපෑමේ ප්‍රසාද මුදලකට අගතියෙන් තොරව සහ, ඔප්පුව යටතේ ක්‍රියාත්මක වන යම් අතිරික්තයක් නොසලකමිනි.

එසේ නොවන්නට, මෙම ඔප්පුවේ නියමයන්, ව්‍යතිරේක සහ කොන්දේසි ආදියට යටත්වේ.

### 10 වෙනි වගන්තිය -
### තෙවන පාර්ශවයන්ගේ දේපළවලට සිදුවන හානි

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන, මෙම ඔප්පුවේ උපලේඛනයේ විස්තර කර ඇති යම් වාහනයක් පාවිච්චි කිරීම හේතුකොටගෙන දේපළවලට සිදුවන හානිය සම්බන්ධයෙන් ගෙවීමට රක්ෂිතයා නෛතිකව බැඳීමට යටත්වන හිමිකම් පාන්නාගේ පිරිවැය සහ වියදම් ඇතුලු මුදල් ගණන් සම්බන්ධයෙන්, එසේ නොවන්නට සමාගම විසින් මෙම ඔප්පුවේ නියමයන්ට, ව්‍යතිරේකයන්ට සහ කොන්දේසිවලට යටත්ව, රක්ෂිතයා හානිපූරණය කරනු ලබන බවටත්, එසේ වූවද, එම හානිපූරණය යම් එක් හදිසි අනතුරක් සම්බන්ධයෙන් උපලේඛනයේ සඳහන් කර ඇති මුදල් ගණනට සීමාවන බවටත් මෙයින් තේරුම්ගෙන ගිවිසගනු ලැබේ.

### 11 වෙනි වගන්තිය - පුහුණුවන රියදුරු/පදවන්නන්

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන, මෙම ඔප්පුවේ පටහැනිව සඳහන් වන කිසිවක් නොසලකාම, පුහුණුවන රියදුරන් / පදින්නන් සම්බන්ධයෙන් මෝටර් රථ වාහන පනතේ නියමයන් පිළිපැද ඇත්නම්, උපලේඛනයේ විස්තර කර ඇති තැනැත්තා / තැනැත්තන්, උපලේඛනයේ විස්තර කර ඇති වාහනය පැදවීම ඉගෙන ගන්නා කාලය තුලදී ක්‍රියාත්මක වන පරිදි, මෙහි සඳහන් කර ඇති ඔප්පුව දීර්ඝ කර ඇති බව මෙයින් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ.

මෙම දීර්ඝ කිරීම හේතු කොටගෙන, මෙම ඔප්පුවේ 1 වන සහ 2 වන වගන්තිය යටතේ ප්‍රතිපාදන සලස්වා ඇති (පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් කළ යුතු ඇතැම් ගෙවීම් ඇතුලුව) යම් වියදමකින් සහ උපලේඛනයේ විස්තර කර ඇති තැනැත්තා / තැනැත්තන් රිය පැදවීම ඉගෙන ගන්නා අතරතුර සිදුවන එක් එක් හෝ සෑම සිද්ධියක් සම්බන්ධයෙන් මෙම ඔප්පුවේ 2 වන කොන්දේසිය යටතේ සමාගම විසින් තම අභිමතය පාවිච්චි කිරීමේදී දරනු ලබන පළමුවන රුපියල් 2,500/- ක් හෝ දරනු ලැබිය හැකි ඊට අඩු වියදමක් සම්බන්ධයෙන් රක්ෂිතයා වගකිව යුතුවන්නේය.

සමාගම විසින් දරනලද වියදම්වලට, මේ යටතේ රක්ෂිතයා ගෙවිය යුතුව තිබූ මුදල් ද ඇතුලත් වී තිබුණහොත්, එම මුදල රක්ෂිතයා විසින් සමාගමට වහාම ආපසු ගෙවිය යුතුය.

මෙම වගන්තියේ අරමුණ සඳහා **'සිද්ධිය'** යන පාඨයෙන් යම් එක් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් හෝ මෙම ඔප්පුව යටතේ හානිපූරණය ලබාදීමට සම්බන්ධවූ හෝ අදාළවූ එක් හේතුවකින් පැන නගින සිද්ධියක් හෝ සිද්ධි මාලාවක් අදහස් විය යුතුය.

මෙම වගන්තිය යටතේ වගකිව යුතු මුදල් ප්‍රමාණය, ඔප්පුවේ මෙයට කලින් සඳහන්වී ඇති යම් අතිරික්ත වගන්ති වලට අමතරව සැලකිල්ලට ගත යුතුය.

### 12 වෙනි වගන්තිය - බැහැර කරනලද අයිතමයන්

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන ලාම්පුවට, ටයර්වලට, මඩ කවරවලට, බෆර්වලට, බෆර් බ්‍රැකට්වලට, බෆර් ඒප්‍රන්වලට සහ / හෝ සායම්වලට සිදුවන හානි සම්බන්ධයෙන් සෑම හිමිකමක් සඳහාම රුපියල් 1,000/-ක අතිරික්තයට යටත්ව, සමාගම විසින් හානිපූරණය කරනු ලබන බව මෙයින් ප්‍රකාශකොට ගිවිස ගනු ලැබේ.

### 13 වෙනි වගන්තිය - මාර්ග බලපත්‍ර සහිත බස්රථ

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන, මෙම ඔප්පුවේ 2 වන වගන්තියේ 2 (ඇ) උප වගන්තියේ පටහැනිව සඳහන් වන කිසිවක් නොසලකාම, එසේ වූවද, වෙනත් ආකාරයකට, මෙම ඔප්පුවේ සඳහන් වන නියමයන්, ව්‍යතිරේක සහ කොන්දේසිවලට යටත්ව, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති යම් වාහනයක් තුල හෝ ඒ මත ගෙනයනු ලබන හෝ එයට ඇතුල්වන හෝ නගින හෝ එයින් බසින යම් මගියකුට සිදුවන මරණය හෝ ශාරීරික තුවාල සම්බන්ධයෙන් ගෙවීමට ඔහු නෛතිකව යටත්වන හිමිකම් ගාස්තු සහ වියදම් ඇතුලු සියලුම මුදල් ගණන් සම්බන්ධයෙන්, සමාගම විසින් රක්ෂිතයා හෝ මෙම ඔප්පුවේ 2 වන වගන්තිය යටතේ හානිපූරණය කරන ලද වෙනත් යම් තැනැත්තකු හානිපූරණය කරනු ලැබේ.

එතෙකුදු වූවද, උපලේඛනයේ සඳහන් කර ඇති ආසන සංඛ්‍යාවට වඩා වැඩි (කොන්දොස්තරවරයකු / සහායකවරයකු සිටීනම් ඔහුට සහ රියදුරුට අමතරව) මගීන් සංඛ්‍යාවක්, එම වාහනයෙහි ගෙනයනු ලබන අවස්ථාවකදී හදිසි අනතුරක් සිදුවන හැම විටෙකම, එම හදිසි අනතුර සම්බන්ධයෙන්, මෙම වගන්තිය හේතුවෙන් සමාගම විසින් ගෙවිය යුතු මුදලෙන් ප්‍රමාණානුකූල අනුපාතයක්, රක්ෂිතයා විසින් සමාගමට ආපසු ගෙවිය යුතුය.

මෙම දීර්ඝ කිරීම හේතු කොටගෙන, එක් එක් සහ හැම ඉල්ලීමක්ම මත, 1 වන වගන්තිය යටතේ වන වෙනත් යම් අතිරික්තයක් නොසලකාම රුපියල් 500/- ක් වන අනිවාර්ය අතිරික්තයක්, රක්ෂිතයා විසින් දැරිය යුතුය.

මෙහි පටහැනිව සඳහන් වන කිසිවක් නොසලකාම, මෙම ඔප්පුව මගින් ප්‍රදානය කරනු ලැබ ඇති රක්ෂණය පහත සඳහන් කරුණුවලට යටත් වන බව මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලැබේ.

1. අදාළ රියදුරා, මේ යටතේ රක්ෂණය කරනු ලැබ ඇති වාහන පන්තිය පැදවීම සඳහා යෝග්‍ය බවට ලංකා ඔටෝමොබයිල් සංගමය වෙතින් ලබාගන්නා ලද ප්‍රවීණතා සහතිකයක් රක්ෂිතයා විසින් රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම වාහන පන්තිය පැදවීම පිළිබඳ පළපුරුද්ද, අවුරුදු තුනකට වැඩි බව රක්ෂිතයා විසින් තහවුරු කළ යුතුය.

2. එබඳු රියදුරකුගේ උපරිම වයස අවුරුදු 65 ට වැඩි නොවිය යුතු අතර, වයස අවුරුදු 30 ට අඩු රියදුරකු විසින් පදවනු ලබන එබඳු යම් වාහනයක්, ඔප්පුව යටතේ වන වෙනත් යම් අතිරික්තයක් නොසලකාම, රුපියල් 1,000/- ක් වන අතිරික්තයකට යටත් වන්නේය.

3. අදාළ වාහනය පාවිච්චි කළ හෝ අලුත්වැඩියාකොට සකස්කරන ලද වාහනයක් නම් එම වාහනයේ යෝග්‍යතාවය, මාර්ගයේ ධාවනයට සුදුසු බව සහ සාමාන්‍ය තත්ත්වය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය නියෝජිතයන්ගෙන් හෝ ලංකා ඔටෝමොබයිල් සංගමයෙන් පූර්ණ පරීක්ෂණ සහතිකයක් රක්ෂිතයා විසින් ලබාගත යුතුය.

### 14 වෙනි වගන්තිය - කුලී වාහන
### කුලියට ගත් තැනැත්තා විසින් ධාවනය කිරීම

මෙම ඔප්පුවේ සඳහන් කිසිවකට පටහැනි වූවද, මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලබන්නේ, උපලේඛනයේ / උපලේඛනවල සඳහන් කර ඇති වාහනය රක්ෂිතයාගේ වගකීම යටතේ පවත්වාගනිමින් කුලී ගැණුම්කරු විසින් හෝ ඔහුගේ සේවකයකු විසින් පදවන ලද්දේ නම්, මේ රක්ෂණ ඔප්පුව එසේ කුලියට දී තිබෙන තත්ත්වය යටතේ ක්‍රියාත්මක වනු ඇති බවයි. එනම්,

(1) ඔහු (එනම්, රක්ෂිතයාගෙන් වාහනය කුලී පදනම මත ලබාගත් පුද්ගලයා) රක්ෂිතයා සමග කුලී ගිවිසුමකට එළඹ සිටියේ නම් සහ එකී කුලී පදනම මත වාහනය සතුකර ගැනීමට පෙර අදාළ ප්‍රකාශන ලියවිලි සතුටුදායක ලෙස සම්පූර්ණ කොට අත්සන් කර තිබිය යුතුය. (එම ලියවිල්ලෙහි ආකෘතියක් මෙයට අමුණා ඇත).

(2) තවද, ඔහු පහත සඳහන් පරිදි රක්ෂිතයා සෑහීමට පත්කොට තිබිය යුතුය:

(අ) මේ වාහනය පදවනු ලබන්නේ එය පැදවීමට අවශ්‍ය රියදුරු බලපත්‍රයක් සතු අයෙක් විය යුතු අතර ඔහුගේ රියදුරු බලපත්‍රය පිටසත් යොදා නොතිබිය යුතුය.

(ආ) යථෝක්ත තැනැත්තාට කිසියම් රක්‍ෂණ ආයතනයකින් රක්‍ෂණයක් නිකුත් කිරීම ප්‍රතික්‍ෂේප කර නොතිබිය යුතුය. එසේම, ඔහු වෙත ඒ අයුරින් නිකුත් කර තිබූ රක්‍ෂණ ඔප්පුවක් එකී රක්‍ෂණ සමාගම විසින් අවලංගු කර නොතිබිය යුතුය. එසේම, ඔහු වෙත නිකුත් කර තිබූ රක්‍ෂණ ඔප්පුවක් ඔහුගේ හිමිකම් ලබාගැනීමේ තත්ත්වය සැලකිල්ලට ගෙන විශේෂ කොන්දේසි යොදා හෝ අතිරේක වාරික අයකොට නොතිබිය යුතුය.

යථෝක්ත වාහනය එය කුලී පදනම මත ලබාගත් තැනැත්තා භාරයේ පවතින විට රක්‍ෂණ සමාගම පහත සඳහන් කරුණු සම්බන්ධව වගකීම භාර නොගනී.

(i) කුලී ගැනුම්කරු විසින් එකී වාහනය සොරකම් කිරීම නිසා හෝ එවැන්නක් මගින් පැන නැගුණු තත්ත්වයක් යටතේ වාහනයට අලාභහානි සිදුවූ විට සහ එකී වාහනය කුලී ගැණුම්කරු විසින් යම් වෙනස්කම් වලට භාජනය කිරීම මගින් ඇතිවූ හා පැන නැගුණු අලාභහානි.

(ii) එකී කුලී ගැණුම්කරු විසින් එම වාහනය මගින් ප්‍රවාහනය සහ / හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා කුලී පදනම මත හෝ පාරිතෝෂිකයක් මත භාවිතා කර තිබියදී සිදුවන හානි.

මේ සම්බන්ධයෙන් තවදුරටත් තේරුම්ගත යුත්තේ සහ එකඟ විය යුත්තේ, වාහනයේ කුලී ගැණුම්කරු ඉහත ප්‍රකාශිත අදාළ කොන්දේසි ලියවිලි ප්‍රකාශනය නියමිත පරිදි සම්පූර්ණ කොට එය රක්ෂිතයා විසින් රක්‍ෂණ යෝජනාපත්‍රය සමග රක්‍ෂණ සමාගම වෙත භාරදී තිබීම හිමිකම් නිරාකරණයට අදාළව පූර්ව කොන්දේසියක් වන බවයි. මේ වගන්තිය අනුව ගිවිසුමට පදනම වන්නේ එයයි.

තවද, පහත සඳහන් අනිවාර්ය අතිරික්තය ද අදාළවේ:

| | |
|---|---|
| මෝටර් සයිකල් | රු. 2,000/- |
| අනෙකුත් සියළු වාහන | රු. 5,000/- |

### 15 වෙනි වගන්තිය - රිය පැදවීම ඉගැන්වීම

මෙහි පටහැනිව සඳහන් වන කිසිවක් නොසලකාම, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති වාහනය, රක්ෂිතයා හෝ ඔහුගේ අවසර ලත් නියෝජිතයා විසින් 1951 අංක 14 දරන මෝටර් රථ වාහන පනතෙහි සඳහන් රිය පැදවීම පුහුණුවන්නන්ට අදාල නියමයන්ට යටත්ව, රිය පැදවීම පුහුණු කිරීම සඳහා භාවිතා කළ හැකි පරිදි, මෙහි සඳහන් කර ඇති ඔප්පුව දීර්ඝ කරනු ලැබේ.

මෙම දීර්ඝ කිරීම හේතුකොටගත්, එක් එක් සෑම හිමිකමක් සඳහාම, ඔප්පුව යටතේ වන වෙනත් යම් අතිරික්තයක් නොසලකාම රුපියල් 2,500/- ක් වන මුදලක් රක්ෂිතයා විසින් දරාගත යුතුය.

### 16 වෙනි වගන්තිය - ජලගැලීම්

ජලගැලීමක සෘජුව හෝ වක්‍රව හෝ ආසන්නව හෝ දුරස්ථව හේතුවූ හෝ දායකවූ හෝ ආරම්භවූ යම් වගකීම් සහ / හෝ හදිසි අනතුරු හානි හෝ අලාභ මෙම ඔප්පුව යටතේ ආවරණය වී ඇති බව මෙයින් ප්‍රකාශකොට ගිවිස ගනු ලැබේ.

### 17 වෙනි වගන්තිය - තීරුබදු රහිත වාහන

මෙම ඔප්පුවේ උපලේඛනයේ දැක්වෙන රක්ෂිතයා විසින් ප්‍රකාශ කර ඇති පරිදි, උපාංග සහ අමතර කොටස් ඇතුලත්වන ඇස්තමේන්තුගත වටිනාකම දේශීය තිරුබදු ඇතුලත් නොවන බවට මෙයින් ප්‍රකාශ කොට එකඟවනු ලැබේ.

ඉහත සඳහන් කාරණා සැලකිල්ලට ගනිමින්, කොටස් ප්‍රතිස්ථාපනයට අවශ්‍ය වන පරිදි, මෙම ඔප්පුවේ 1 වෙනි කොටස යටතේ හිමිකමක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, එම කොටස් සම්බන්ධයෙන් සමාගමේ වගකීම් එම කොටස් සඳහාවූ දේශීය තිරුබදු අයත් නොවන බවට මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලැබේ.

### 18 වෙනි වගන්තිය - වැඩවර්ජන කැරළි කෝලාහල මහජන කැළඹීම්

රක්ෂිතයා විසින් අතිරේක වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවේ 4 වන පොදු ව්‍යතිරේකයේ සඳහන් වන වැඩවර්ජන, කෝලාහල සහ ජනකැළඹීම් සඳහා පමණක් ආවරණය දීර්ඝ කරනු ලැබේ.

(1) එම වැඩවර්ජන, කෝලාහල සහ ජන කැළඹීම් යන වචන (වැඩවර්ජනයක් හෝ පිටලෑමක් යන කවරක් හෝ සම්බන්ධයෙන් වුවද) මහජන සාමය කඩකිරීමකට, සෙසු තැනැත්තන් සමග සහභාගිවන යම් තැනැත්තකුගේ ක්‍රියාවක්,

(2) එබඳු යම් සාමය කඩකිරීමක් මැඩපැවැත්වීම හෝ මැඩපැවැත්වීමට උත්සාහ කිරීමේදී නීත්‍යානුකූලව සංස්ථාපනය කරන ලද බලධරයකුගේ ක්‍රියාවක් හෝ,

(3) වැඩවර්ජනයකට ආධාර කිරීම හෝ පිටලෑමකට ප්‍රතිරෝධයක් වශයෙන් සිදුකරන ලද වැඩවර්ජකයකුගේ හෝ පිටලනලද සේවකයකුගේ චේතනාන්විත ක්‍රියාවක්, හෝ

(4) එබඳු යම් ක්‍රියාවක් වැළැක්වීමේදී හෝ වැළැක්වීමට උත්සාහ කිරීමේදී හෝ එබඳු යම් ක්‍රියාවක ප්‍රතිඵල අවම කිරීම සඳහා හෝ නීත්‍යානුකූලව සංස්ථාපනය කරනලද බලධරයකුගේ ක්‍රියාවක්,

නිසා කෙළින්ම සිදුවන යම් හදිසි අනතුරකට, අලාභයකට හානියකට හෝ වගකීමකට අදාල නොවේ.

එතෙකුදු වුවද, මෙම වගන්තිය හේතුවෙන් කරන ලද හානිපූරණය, (ව්‍යවස්ථාවේ නියමයන් සපුරාලීම පිණිස අවශ්‍ය වන තරමට හැර)

(අ) යුද්ධයක්, ආක්‍රමණයක්, විදෙස් සතුරු ක්‍රියාවක්, එදිරිවාදිකම් හෝ (යුද්ධ ප්‍රකාශ කරනු ලැබුවද, නොලැබුවද) යුද්ධයක් වැනි මෙහෙයුම්, සිවිල් යුද්ධයක්

(ආ) හමුදා කැරැල්ලක්, මහජන නැගී සිටීමක් ප්‍රමාණයට පත්වූ හෝ එවැන්නක් බවට පත්වූ ජන කැළඹීමක්, යුධ හමුදා නැගී සිටීමක්, කැරැල්ලක්, විප්ලවයක්, යුධ හමුදා හෝ පැහැරගත් බලයක්, යුධ නීතිය හෝ වටලනු ලැබූ තත්ත්වයක් ප්‍රකාශයට පත්කළ යුතු හෝ පවත්වාගෙන යායුතු යයි තීරණය කිරීමට තුඩු දෙන සිද්ධි හෝ හේතු,

(ඇ) යම් ත්‍රස්තවාදී ක්‍රියා යන්නෙහි තේරුම, බලය හෝ ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීම ඇතුළුව නමුත්, එයට සීමා නොවූ ක්‍රියාවක් සහ / හෝ දේශපාලනික, ආගමික, දෘෂ්ටි මතවාදය හෝ යම් රජයකට බලපෑම් කිරීමේ අරමුණු ඇතුළු සහ / හෝ මහජනතාව හෝ මහජනතාවෙන් යම් කොටසක් බියගැන්වීමේ අරමුණ ඇතුළු ජනවාර්ගික අරමුණු හෝ හේතු සහිතව තනිව ක්‍රියාකරන හෝ යම් සංවිධානයක් හෝ රජයක් වෙනුවෙන් ක්‍රියාකරන යම් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් එසේ බියගැන්වීමේ ක්‍රියාවයි.

තවද, රජයේ ආරක්‍ෂක හමුදාවන් ඉහත විස්තර කර ඇති යම් කණ්ඩායමක් අතර යම් ක්‍රියාදාමයක් පාලනය කිරීම, වැළැක්වීම, මැඩපැවැත්වීම සඳහා ගොඩබිමේ දී, සයුරේ දී හෝ ගුවනේදී ඇතිවන යම් ගැටුමක සෘජුව හෝ වක්‍රව ඇතිවූ යම් අලාභයක්, හානියක්, කුමන ආකාරයක හෝ පිරිවැය හෝ වියදම ද ඉහත සඳහන් කර ඇති ත්‍රස්තවාදය යන අර්ථකථනයට අන්තර්ගත වේ.

මෙම ඔප්පුව යටතේ යම් හිමිකම් පෑමක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඊට අදාළ හදිසි අනතුර, අලාභය, හානිය හෝ බැඳීම, එකී සිදුවීම් කවරකින් හෝ ස්වාධීනව පැන නැගුනු සහ ඒවාට කිසිම ආකාරයකින් සම්බන්ධ නොවන බව, ඒවා හේතුවෙන් සිදු නොවූ බව, ඒවායේ දායකත්වයෙන් සිදු නොවූ බව හෝ ඒවාට සම්බන්ධ කළ නොහැකි බව, රක්ෂිතයා විසින් ඔප්පු කළ යුතු අතර, එසේ ඔප්පු කරනු නොලැබුවහොත්, එබඳු හිමිකම් පෑමක් සම්බන්ධයෙන් කිසිම ගෙවීමක් කිරීමට සමාගම බැඳීමට යටත් නොවේ.

මෙම රක්ෂණය අවසන් කරන බවට දැන්වීමක්, අවසන් වරට දැන සිටි රක්ෂිතයාගේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවා කවර අවස්ථාවකදී හෝ රක්ෂණ සමාගම් විසින් අවසන් කරනු ලැබිය හැකි බවටත්, එසේ කරනු ලබන අවස්ථාවකදී, අවලංගු කරන ලද දිනයේ සිට, ඉකුත් නොවී ඇති කාලය සඳහා, වාරිකයෙන් තක්සේරු කළ ප්‍රමාණයක් ගෙවීමට රක්ෂණ සමාගම යටත්වන අතර, රක්ෂිතයාගේ ඉල්ලීම මත රක්ෂණය අවසන් කරනු ලැබුවහොත්, වාරිකය හෝ එයින් යම් කොටසක් ආපසු ගෙවීමට සමාගම යටත් නොවන බවටත්, ඔප්පුවේ සඳහන් කරනු ලැබ ඇති කිසිවක් හෝ නොසලකාම, තවදුරටත් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ.

මෙම දීර්ඝ කිරීම පහත සඳහන් කර ඇති ව්‍යතිරේකයනට යටත් වන බව තවදුරටත් ප්‍රකාශ කොට ගිවිසගනු ලැබේ:

## අ. විකිරණශීලී, රසායනික, ජෛව, ජෛවරසායනික සහ විද්‍යුත්චුම්බක අවිආයුධ ව්‍යතිරේක වගන්තිය හඳුන්වාදීම

මෙම වගන්තිය සියල්ලට ප්‍රධාන (පරම) වන අතර, මෙම රක්ෂණයෙහි අඩංගු කිසිවක් මෙයට පටහැනි වුවද, එය අභිබවා අදාළවනු ඇත.

1. කුමන හේතුවක් මත වුවද පහත සඳහන් කර ඇති කරුණු සෘජුව හෝ වක්‍රව හේතුවූ හෝ දායකවූ හෝ ඇතිවූ අලාභයක්, හානියක්, වගකීමක් හෝ වියදමක් මෙම රක්ෂණය මගින් ආවරණය කරනු නොලැබේ:

   1.1 යම් න්‍යෂ්ටික ඉන්ධනවලින් පිටවන න්‍යෂ්ටිකවිකිරණ මගින් අයනීකරණ විකිරණයවීම හෝ දූෂණයවීම

   1.2 න්‍යෂ්ටික විකිරණ, විෂ, පුපුරණ ද්‍රව්‍ය හෝ අනෙකුත් අන්තරාදායක හෝ යම් න්‍යෂ්ටික සවිකිරීම්වල, ප්‍රතික්‍රියාවල හෝ අනෙකුත් න්‍යෂ්ටික සංගතිවල හෝ එහි න්‍යෂ්ටික සංරචකවල දූෂණ වස්තූන්

   1.3 පරමාණු හෝ න්‍යෂ්ටික පිපිරීම් සහ / හෝ උණුවීම් හෝ වෙනත් ඒ හා සමාන ප්‍රතික්‍රියා හෝ න්‍යෂ්ටික විකිරණ හෝ ද්‍රව්‍ය යොදා ඇති යම් අවි ආයුධයක් හෝ මෙවලමක්

   1.4 න්‍යෂ්ටික විකිරණ, විෂ, පුපුරණ ද්‍රව්‍ය හෝ අනෙකුත් අන්තරාදායක හෝ යම් න්‍යෂ්ටික විකිරණ වස්තූන්. මෙම උප-වගන්තියෙහි සඳහන්වන ව්‍යතිරේකය න්‍යෂ්ටික ඉන්ධන හැර න්‍යෂ්ටික විකිරණ සමස්ථානිකයන් සඳහා දීර්ඝ කරනු නොලැබේ. එකී සමස්ථානිකයන් වාණිජ, කෘෂිකාර්මික, වෛද්‍ය, විද්‍යාත්මක හෝ අනෙකුත් ඒ හා සමාන සාමකාමී අරමුණු සඳහා පිළියෙළ කරන්නේනම්, රැගෙන යනු ලබන්නේනම්, ගබඩාකර තබන්නේනම් හෝ භාවිතා කරනු ලබන්නේනම් මෙම බැහැරකිරීම අදාල නොවන්නේය.

   1.5 යම් රසායනික, ජෛව, ජෛව රසායනික හෝ විද්‍යුත් චුම්බක අවි ආයුධ.

## ආ. සයිබර් පහරදීම් ව්‍යතිරේක වගන්තිය හඳුන්වාදීම

1.1 පහත 1.2 වෙනි වගන්තියට පමණක් යටත්ව, යම් පරිගණක පද්ධතියකට, පරිගණක මෘදුකාංග වැඩසටහනකට හානියක් ඇතිකිරීමේ මාර්ගයක් හෝ මෙවලමක් වශයෙන් ද්වේෂ සංකේතයක්, පරිගණක වෛරසයක් හෝ ක්‍රියා පටිපාටියක් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් පාවිච්චි කිරීමෙන් හෝ මෙහෙයවීමෙන් දායකවූ හෝ සිදුවූ අලාභය, හානිය, වගකීම හෝ වියදම කිසිසේත් මෙම රක්ෂණයෙන් ආවරණය කරනු නොලැබේ.

1.2 යුද්ධයක, සිවිල් යුද්ධයක, විප්ලවයක, කැරැල්ලක, කළකෝලාහලයක හෝ එමගින් ඇතිවූ මහජන කැළඹීම්, හෝ ත්‍රස්තවාදය හෝ දේශපාලන අරමුණක් සහිතව ක්‍රියාකරන යම් පුද්ගලයකු විසින් කරනු ලබන ඒදිරිවාදී ක්‍රියා ආදි අවදානම් ආවරණය කරනු ලබන ඔප්පුවල එකී වගන්තිය පිටසන් කර ඇති අවස්ථාවන්වලදී (වෙනත් ආකාරයකින් ආවරණය කරනු ලැබිය හැකි) යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක්, හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික පද්ධතියක පරිගණක මෘදුකාංග වැඩසටහනක් දියත්කිරීමේදී සහ / හෝ යම් අවි ආයුධයක හෝ මිසයිලයක වෙඩි තැබීමේ යාන්ත්‍රණයක් භාවිතා කිරීමෙන් ඇතිවූ හානි බැහැර කිරීම සඳහා 1.1 වෙනි වගන්තිය ක්‍රියාත්මක නොවන්නේය.

1.3 යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික පද්ධතියක පරිගණක මෘදුකාංග භාවිතා කිරීමෙන් ඇතිවන හානි බැහැරකිරීම සඳහා (එසේ නොමැතිනම් ආවරණය වන) ක්‍රියාත්මක නොවේ.

මෙම දීර්ඝ කිරීම ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සහ එය වෙනුවෙන් ලබාදෙනු ලබන අතර, මෙම විශේෂිත දීර්ඝ කිරීම යටතේ කුමන ආකාරයේ වගකීමක් සම්බන්ධයෙන් වුවද සාරෝපණය විය යුත්තේ එකී අරමුදල මගිනි. මෙම පිටසන මගින් යම් හානියක් හෝ අලාභයක් ආවරණය කර නොමැති යයි යම් නඩුවක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවහොත් එකී අලාභය හෝ හානිය ආවරණය කර ඇති බව ඔප්පු කිරීමේ වගකීම රක්ෂිතයා මත පැවරේ.

එසේ නොමැතිවූ විට, ඔප්පුවේ නියමයන්, කොන්දේසි, බැහැරකිරීම් සහ ව්‍යතිරේකවලට යටත්වනු ඇත.

## 19 වෙනි වගන්තිය - ත්‍රස්තවාදය

අමතර වාරිකයක් ගෙවා තිබීම හේතු කොටගෙන, මෙහිලා නිකුත් කර ඇති ඔප්පුවේ වැඩවර්ජන, කෝලාහල සහ මහජන කැළඹීම් පිටසනට / වගන්තියට / දීර්ඝ කිරීමට වගන්තියේ පටහැනිව සඳහන්වන කිසිවක් නොසලකාම, ප්‍රකාශ කොට ගිවිසගනු ලබන්නේ, මෙහිලා ප්‍රදානය කර ඇති රක්ෂණාවරණය යම් ත්‍රස්තවාදී ක්‍රියාවක් මගින් ඇතිවූ හෝ එයට සෘජුවම සම්බන්ධ වූ අනුශාංගික අලාභය හැර අලාභය, හානිය ඇතුලත් කිරීම සඳහා දීර්ඝ කර ඇති බවයි. යම් ත්‍රස්තවාදී ක්‍රියා යන්නෙහි තේරුම, බලය හෝ ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීමේ ඇතුළුව, නමුත් එයට සීමා නොවූ ක්‍රියාවක් සහ / හෝ දේශපාලනික, ආගමික, දෘෂ්ටි මතවාදය හෝ යම් රජයකට බලපෑම් කිරීමේ අරමුණු ඇතුළු සහ / හෝ මහජනතාව හෝ මහජනතාවෙන් යම් කොටසක් බියගැන්වීමේ අරමුණ ඇතුළු ජනවාර්ගික අරමුණු හෝ හේතු සහිතව තනිව ක්‍රියාකරන හෝ යම් සංවිධානයක් හෝ රජයක් වෙනුවෙන් ක්‍රියාකරන යම් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් එසේ බියගැන්වීමේ ක්‍රියාවයි.

තවද, රජයේ ආරක්ෂක හමුදාවත් ඉහත විස්තර කර ඇති යම් කණ්ඩායමක් අතර යම් ක්‍රියාදාමයක් පාලනය කිරීම, වැළැක්වීම, මැඩපැවැත්වීම සඳහා ගොඩබිමේ දී, සයුරේ දී හෝ ගුවනේ දී ඇතිවන යම් ගැටුමක සෘජුව හෝ වක්‍රව ඇතිවූ යම් අලාභයක්, හානියක්, කුමන ආකාරයක හෝ පිරිවැය හෝ වියදම ද ඉහත සඳහන් කර ඇති ත්‍රස්තවාදය යන අර්ථකථනයට අන්තර්ගත වේ.

එතෙකුදු වුවද, මෙම දීර්ඝ කිරීම මගින්,

අ. කවරාකාරයක හෝ විස්තරයකට ගැලපෙන අනුශාංගිකව හෝ චක්‍රාකාරව සිදුවන අලාභයක් හෝ හානියක්,

ආ. මුළුමණින්ම හෝ අර්ධ වශයෙන් වැඩ නැවැත්වීම, යම් ක්‍රියාවලියක් හෝ මෙහෙයුමක් පමා කිරීම, ඊට මැදිහත් වීම හෝ නැවැත්වීම හේතුකොටගෙන සිදුවන අලාභය හෝ හානිය,

ඇ. නීත්‍යානුකූලව ස්ථාපිත යම් අධිකාරියක් විසින් රාජසන්තක කිරීමේ, බලෙන් ලබාගැනීමේ හෝ ප්‍රතිඵලයක් ලෙස සිදුවන ස්ථිර හෝ තාවකාලික භුක්තියෙන් පහ කිරීමක් හේතුවෙන් හටගන්නා අලාභයක් හෝ හානියක්, ආවරණය නොවේ.

රක්ෂණය කරනලද යම් එක් වාහනයකට සිදුවන හානියක් සම්බන්ධ උපරිම වගකීම, යම් එක් සිද්ධියක් සම්බන්ධයෙන් රුපියල් 50,000,000/- ට හෝ මෙම වගන්තිය යටතේ රක්ෂිත මුදල යන දෙකෙන් අඩුම ප්‍රමාණයට වැඩි නොවිය යුතුය.

මෙම ඔප්පුවේ පටහැනිව යමක් සඳහන් වුවද, ඒ පිළිබඳව නොසලකාම, රක්ෂණ සමාගම විසින් ඔප්පුවට එකතු කර ඇති ත්‍රස්තවාදී ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, රක්ෂිතයාට ප්‍රමාණානුකූල ආපසු ගෙවීමක් අනුමත කරනු ලැබේ. කෙසේවෙතත්, රක්ෂිතයාගේ ඉල්ලීම මත මෙම ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, කිසිම වාරික ආපසු ලබාදීමක් කරනු නොලැබේ.

මෙම දීර්ඝ කිරීම පහත සඳහන් කර ඇති ව්‍යතිරේකයනට යටත්වන බව තවදුරටත් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ:

## අ. විකිරණශීලී, රසායනික, ජෛව, ජෛවරසායනික සහ විද්‍යුත්චුම්බක අවිආයුධ ව්‍යතිරේක වගන්තිය හඳුන්වාදීම

මෙම වගන්තිය සියල්ලට ප්‍රධාන (පරම) වන අතර, මෙම රක්ෂණයෙහි අඩංගු කිසිවක් මෙයට පටහැනි වුවද, එය අභිබවා අදාළවනු ඇත.

1. කුමන හේතුවක් මත වුවද පහත සඳහන් කර ඇති කරුණු සෘජුව හෝ වක්‍රව හේතුවූ හෝ දායකවූ හෝ ඇතිවූ අලාභයක්, හානියක්, වගකීමක් හෝ වියදමක් මෙම රක්ෂණය මගින් ආවරණය කරනු නොලැබේ:

   1.1 යම් න්‍යෂ්ටික ඉන්ධනවලින් පිටවන න්‍යෂ්ටිකවිකිරණ මගින් අයනීකරණ විකිරණයවීම හෝ දූෂණයවීම

   1.2 න්‍යෂ්ටික විකිරණ, විෂ, පුපුරණ ද්‍රව්‍ය හෝ අනෙකුත් අන්තරාදායක හෝ යම් න්‍යෂ්ටික සවිකිරීම්වල, ප්‍රතික්‍රියාවල හෝ අනෙකුත් න්‍යෂ්ටික සංගතිවල හෝ එහි න්‍යෂ්ටික සංරචකවල දූෂණ වස්තූන්

   1.3 පරමාණු හෝ න්‍යෂ්ටික පිපිරීම් සහ / හෝ උණුවීම් හෝ වෙනත් ඒ හා සමාන ප්‍රතික්‍රියා හෝ න්‍යෂ්ටික විකිරණ හෝ ද්‍රව්‍ය යොදා ඇති යම් අවි ආයුධයක් හෝ මෙවලමක්

   1.4 න්‍යෂ්ටික විකිරණ, විෂ, පුපුරණ ද්‍රව්‍ය හෝ අනෙකුත් අන්තරාදායක හෝ යම් න්‍යෂ්ටික විකිරණ වස්තූන්. මෙම උප-වගන්තියෙහි සඳහන්වන ව්‍යතිරේකය න්‍යෂ්ටික ඉන්ධන හැර න්‍යෂ්ටික විකිරණ සමස්ථානිකයන් සඳහා දීර්ඝ කරනු නොලැබේ. එකී සමස්ථානිකයන් වාණිජ, කෘෂිකාර්මික, වෛද්‍ය, විද්‍යාත්මක හෝ අනෙකුත් ඒ හා සමාන සාමකාමී අරමුණු සඳහා පිළියෙළ කරන්නේනම්, රැගෙන යනු ලබන්නේනම්, ගබඩාකර තබන්නේනම් හෝ භාවිතා කරනු ලබන්නේනම් මෙම බැහැරකිරීම අදාළ නොවන්නේය.

   1.5 යම් රසායනික, ජෛව, ජෛව රසායනික හෝ විද්‍යුත් චුම්බක අවි ආයුධ.

## ආ. සයිබර් පහරදීම් ව්‍යතිරේක වගන්තිය හඳුන්වාදීම

1.1 පහත 1.2 වෙනි වගන්තියට පමණක් යටත්ව, යම් පරිගණක පද්ධතියකට, පරිගණක මෘදුකාංග වැඩසටහනකට හානියක් ඇතිකිරීමේ මාර්ගයක් හෝ මෙවලමක් වශයෙන් ද්වේෂ සංකේතයක්, පරිගණක වෛරසයක් හෝ ක්‍රියා පටිපාටියක් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් පාවිච්චි කිරීමෙන් හෝ මෙහෙයවීමෙන් දායකවූ හෝ සිදුවූ අලාභය, හානිය, වගකිම හෝ වියදම කිසිසේත් මෙම රක්ෂණයෙන් ආවරණය කරනු නොලැබේ.

1.2 යුද්ධයක, සිවිල් යුද්ධයක, විප්ලවයක, කැරැල්ලක, කළකෝලාහලයක හෝ එමගින් ඇතිවූ මහජන කැළඹීම්, හෝ ත්‍රස්තවාදය හෝ දේශපාලන අරමුණක් සහිතව ක්‍රියාකරන යම් පුද්ගලයකු විසින් කරනු ලබන එදිරිවාදී ක්‍රියා ආදි අවදානම් ආවරණය කරනු ලබන ඔප්පුවල එකී වගන්තිය පිටසන් කර ඇති අවස්ථාවන්වලදී (වෙනත් ආකාරයකින් ආවරණය කරනු ලැබිය හැකි) යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක්, හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික පද්ධතියක පරිගණක මෘදුකාංග වැඩසටහනක් දියත්කිරීමේදී සහ / හෝ යම් අවි ආයුධයක හෝ මිසයිලයක වෙඩි තැබීමේ යාන්ත්‍රණයක් භාවිතා කිරීමෙන් ඇතිවූ හානි බැහැර කිරීම සඳහා 1.1 වෙනි වගන්තිය ක්‍රියාත්මක නොවන්නේය.

මෙම දීර්ඝ කිරීම ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සහ එය වෙනුවෙන් ලබාදෙනු ලබන අතර, මෙම විශේෂිත දීර්ඝ කිරීම යටතේ කුමන ආකාරයේ වගකීමක් සම්බන්ධයෙන් වුවද සාරෝපණය විය යුත්තේ එකී අරමුදල මගිනි. මෙම පිටසන මගින් යම් හානියක් හෝ අලාභයක් ආවරණය කර නොමැති යයි යම් නඩුවක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවහොත් එකී අලාභය හෝ හානිය ආවරණය කර ඇති බව ඔප්පු කිරීමේ වගකීම රක්ෂිතයා මත පැවරේ.

එසේ නොමැතිවූ විට, ඔප්පුවේ නියමයන්, කොන්දේසි, බැහැරකිරීම් සහ ව්‍යතිරේකවලට යටත්වනු ඇත.

## 20 වෙනි වගන්තිය - අනිවාර්ය අතිරික්තය

මෙම ඔප්පුවේ 1 වෙනි කොටසේ අඩංගු කිසිවකට පටහැනි වුවද, ඒ පිළිබඳව නොසලකා මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලබන්නේ, එක් එක් සහ සෑම සිද්ධියක් සම්බන්ධයෙන්ම, උපලේඛනයෙහි නිශ්චිතවම සඳහන් කර ඇති එම මුදල (හෝ වියදම් කරනු ලැබිය හැකි ඊට වඩා අඩු මුදලක්) එය යටතේ විධිවිධාන සලස්වා ඇති වියදම (පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් ගෙවීම් තිබේ නම්, ඒවාද ඇතුළුව) සහ මෙම ඔප්පුවේ 4 වෙනි කොන්දේසිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේදී දැරිය හැකි වියදමට සහ සමාගම විසින් දරන ලද වියදමට රක්ෂිතයා වගකිව යුතු වන බවයි.

සමාගම විසින් දරනලද වියදම්වලට, මේ යටතේ රක්ෂිතයා ගෙවිය යුතුව තිබූ මුදල් ද ඇතුළත් වී තිබුණහොත්, එම මුදල රක්ෂිතයා විසින් සමාගමට වහාම ආපසු ගෙවිය යුතුය.

මෙම වගන්තියේ අරමුණ සඳහා **'සිද්ධිය'** යන පාඨයෙන් යම් එක් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් හෝ මෙම ඔප්පුව යටතේ හානිපූරණය ලබාදීමට සම්බන්ධවූ හෝ අදාළවූ එක් හේතුවකින් පැන නගින සිද්ධියක් හෝ සිද්ධි මාලාවක් අදහස් විය යුතුය.

## 21 වෙනි වගන්තිය - ආයතනික ණය මුදල

මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති වාහනය ඇපයට තබාගෙන ණයට දෙන ලද මුදල් සැලකිල්ලට ගෙන, උපලේඛනයේ සඳහන් කර ඇති ආයතනයට, එකී වාහනය සම්බන්ධයෙන් අයිතියක් ඇති තාක්කල්, එකී වාහනයට සිදුවූ (අළුත්වැඩියා කිරීමෙන්, යථා තත්ත්වයට පත්කිරීමෙන්, ප්‍රතිස්ථාපනය කිරීමෙන් පිරිමසාලන ලද අලාභය හෝ හානිය) අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන්, මෙම ඔප්පුව යටතේ රක්ෂිතයාට ගෙවිය හැකි සියළුම මුදල සම්බන්ධයෙන්, අයිතියක් දක්වන බවටත්, ඒ සඳහා එකී ආයතනයට ගෙවිය යුතු එම මුදල් තමන්හට ලැබීම සම්බන්ධයෙන් ඔවුන්ගේ තහවුරුව, අලාභය සම්බන්ධයෙන් සමාගම පූර්ණ සහ අවසාන වශයෙන් ගෙවීම් නිමකළ බවට මුද්‍රාහැරීමක් වන්නේය.

## 22 වෙනි වගන්තිය - මාර්ගස්ථ භාණ්ඩ (උපද්‍රව රහිත)

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවා තිබීම හේතු කොටගෙන උපලේඛනයේ සඳහන් කර ඇති යම් වාහනයක් තුල හෝ ඒ මත පටවාගෙන යනු ලබන භාණ්ඩවලට එම වාහනය හැප්පීම හෝ වෙනත් යම් දෙයක ගැටීම හෝ පෙරළීම හේතු කොටගෙන ඇතිවන අලාභය වෙනුවෙන් විශේෂයෙන් ආවරණය කර නොමැති නම්, (ගිනි හෝ පිපිරීම් හෝ වැඩවර්ජන, කැරැල්ල, ජනකැළඹීම් සහ ත්‍රස්තවාදය හේතුවෙන් ඇතිවන අලාභය හැර) රක්ෂිතයාට මෙම ඔප්පුවේ නියමයන් ව්‍යතිරේකයන් සහ කොන්දේසිවලට යටත්ව, සමාගම විසින් හානිපූරණය කරනු ලබන බවට මෙයින් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ. එහෙත්, එම හානිපූරණය යම් එක් සිදුවීමක් සඳහා උපලේඛනයේ සඳහන් මුදල දක්වා සීමා කර ඇත.

එතෙකුදු වුවද, හදිසි අනතුර සිදුවන අවස්ථාවේදී එම වාහනය මගින් ගෙයනු ලබන භාණ්ඩවල මුළු අගය මෙහි රක්ෂිත මුදලට වඩා වැඩිනම් ඇතිවන වෙනස සඳහා රක්ෂිතයාම රක්ෂකයා වශයෙන් සැලකෙන අතර, එම අලාභය සඳහා ඔහු ප්‍රමාණානුකූල කොටසක් දැරිය යුතුය.

පහත සඳහන් අයිතමයන්ට සිදුවන හානි සඳහා මෙම වගන්තිය යටතේ සමාගම වගකියනු නොලබන බවට තවදුරටත් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ:

| | |
|---|---|
| පිහන් බඩු සහ මැටි භාණ්ඩ | ඔරලෝසු හෝ අත් ඔරලෝසු |
| ආභරණ | පෙට්‍රෝලියම් |
| වීදුරු භාණ්ඩ | විදුලි උපකරණ හෝ කොටස් |
| ගෘහ භාණ්ඩ | පින්තූර, මුද්‍රිත පිටපත් හෝ චිත්‍ර |
| අලංකාර සැරසිලි | වීදුරු බඳුන්වල තිබෙන භාණ්ඩ |
| වයින් හෝ ස්ප්‍රීතු | ෆයිබර් |
| කපුවැරලි | පශු සම්පත් |
| කඩදාසි අපද්‍රව්‍ය | විද්‍යාත්මක උපකරණ |
| පුපුරණ ද්‍රව්‍ය | ඉලෙක්ට්‍රොනික අයිතමයන් |
| පින්තූරගැනීමේ උපකරණ | |

මෙම වගන්තියේ අරමුණ සඳහා **'සිද්ධිය'** යන පාඨයෙන් යම් එක් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් හෝ මෙම ඔප්පුව යටතේ හානිපූරණය ලබාදීමට සම්බන්ධවූ හෝ අදාළවූ එක් හේතුවකින් පැන නගින සිද්ධියක් හෝ සිද්ධි මාලාවක් අදහස් විය යුතුය.

### 23 වෙනි වගන්තිය - මාර්ගස්ථ භාණ්ඩ (උපද්‍රව සහිත)

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවා තිබීම හේතු කොටගෙන උපලේඛනයේ සඳහන් කර ඇති යම් වාහනයක් තුළ හෝ ඒ මත පටවාගෙන යනු ලබන භාණ්ඩවලට එම වාහනය හැප්පීම හෝ වෙනත් යම් දෙයක ගැටීම හෝ පෙරළීම හේතු කොටගෙන ඇතිවන ගිනි හෝ පිපිරීම් හේතුවෙන් සෘජුව හෝ වක්‍රව ඇතිවන අලාභය ඇතුළුව / බැහැරව රක්ෂිතයාට මෙම ඔප්පුවේ නියමයන්, ව්‍යතිරේකයන් සහ කොන්දේසිවලට යටත්ව, සමාගම විසින් හානිපූරණය කරනු ලබන බවට මෙයින් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ. එහෙත් එම හානිපූරණය යම් එක් සිදුවීමක් සඳහා උපලේඛනයේ සඳහන් මුදල දක්වා සීමා කර ඇත.

එසේකුදු වුවද, හදිසි අනතුර සිදුවන අවස්ථාවේදී එම වාහනය මගින් ගෙයනු ලබන භාණ්ඩවල මුළු අගය මෙහි රක්ෂිත මුදලට වඩා වැඩිනම් ඇතිවන වෙනස සඳහා රක්ෂිතයාම රක්ෂකයා වශයෙන් සැලකෙන අතර, එම අලාභය සඳහ ඔහු ප්‍රමාණානුකූල කොටසක් දැරිය යුතුය.

මෙම වගන්තියේ අරමුණ සඳහා 'සිද්ධිය' යන පාඨයෙන් යම් එක් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් හෝ මෙම ඔප්පුව යටතේ හානිපූරණය ලබාදීමට සම්බන්ධවූ හෝ අදාළවූ එක් හේතුවකින් පැන නගින සිද්ධියක් හෝ සිද්ධි මාලාවක් අදහස් විය යුතුය.

විශේෂයෙන් ආවරණය සලසා නොමැතිනම්, මෙම වගන්තිය යටතේ ලබාදී ඇති ආවරණයට පෙට්‍රෝලියම්, කෙඳි, කපු, කපු වැරලි සහ පුපුරණ ද්‍රව්‍ය ඇතුලත් නොවනු ඇත.

### 24 වෙනි වගන්තිය - අමතර කොටස් සොරකම් දීර්ඝ කිරීම (පෞද්ගලික ද්විත්ව කාර්ය වාහන සඳහා පමණයි)

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන එකම අවස්ථාවකදී වාහනය සොරකම් කරනු නොලැබුවද, ගෙවල් බිඳීම්, මංකොල්ලකෑම් හෝ සොරකම් ආදි හේතුවෙන් එහි උපාංගවලට, අමතර කොටස්වලට සහ / හෝ අනුකලන කොටස්වලට සිදුවන අලාභ හෝ හානි සම්බන්ධයෙන් රක්ෂිතයා හානිපූරණය කිරීම සඳහා මෙම ඔප්පුව දීර්ඝ කෙරෙන බව මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලැබේ.

මෙම දීර්ඝ කිරීම හේතු කොටගෙන ඔප්පුවේ නියමයන්, ව්‍යතිරේකයන් සහ කොන්දෙසිවලට යටත්ව, වෙනත් යම් අතිරික්තයක් තිබීම නොසලකාම, සෑම හිමිකමක් සඳහාම පළමු රුපියල් 2,000/- රක්ෂිතයා දැරිය යුතුය.

### 25 වෙනි වගන්තිය - ස්වභාවික විපත්

මෙම රක්ෂණ ඔප්පුව යටතේ සලසා ඇති ආවරණය, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළවලට මෙහි පහත සඳහන් උපද්‍රවයක් හේතුවෙන් හෝ එමගින් හෝ එහි ප්‍රතිඵලක් වශයෙන් අලාභයක් හෝ හානියක් ඇතිවුවහොත්, හානිපූරණය කිරීම සඳහා දීර්ඝ කරනු ලබන බවට මෙයින් ප්‍රකාශ කොට ගිවිස ගනු ලැබේ.

- අ. සුනාමි
- ආ. උදම්රළ
- ඇ. භූමිකම්පා
- ඈ. ගිනිකඳු පිපිරීම්
- ඉ. සැඩසුලං සහ ටෙම්පස්ට්
- ඊ. නායයෑම්
- උ. පස්කඳු කඩා වැටීම්
- ඌ. හරිකේන් සැඩසුලං
- එ. ටෝනැඩෝ සැඩසුලං
- ඒ. සුළිසුලං

ඉහත සඳහන් රක්ෂිත උපද්‍රවවලට සම්බන්ධ නොවූ අනෙකුත් වායු ගෝලීය කැළඹීම් සහ ස්වභාවික උපද්‍රවයන්ගේ සෘජු හෝ වක්‍ර හේතූන් මත ඇතිවන යම් අලාභයක් හෝ හානියක් මෙම රක්ෂණය මගින් ආවරණය කරනු නොලැබේ.

### 26 වෙනි වගන්තිය - ත්‍රස්තවාදී පිටසන මෝටර් යටතේ මාර්ගස්ථ භාණ්ඩ

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවට එකතු කර ඇති වැඩ වර්ජන, කැරළි කෝලාහල, මහජන කැළඹීම් සහ ත්‍රස්තවාදී පිටසන, මෙම පිටසන මගින් ප්‍රදානය කර ඇති ආවරණයටද අදාළ වන බව මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලැබේ.

කෙසේ වෙතත්, ගෙවනු නොලැබිය හැකි එහෙත් වැඩ වර්ජන, කැරළි කෝලාහල, මහජන කැළඹීම් සහ ත්‍රස්තවාදී පිටසන සඳහා ගෙවනු ලබන එක් එක් සහ සෑම අලාභයකදීම රුපියල් 5,000/- ක උපරිමයට යටත්ව භාණ්ඩ සඳහා රක්ෂිත මුදලේ පළමු 10% සඳහා රක්ෂිතයා වගකිව යුතුය.

තවද, යම් එක් අලාභයක් සඳහා සමාගමෙහි වගකීම හදිසි අනතුර සිදුවන අවස්ථාවේදී රැගෙනගිය භාණ්ඩවල උපරිම ප්‍රමාණය හෝ රක්ෂිත මුදල යන දෙකෙන් අඩුම මුදල ඉක්ම නොවිය යුතුය.

මේ යටතේ හිමිකමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් සිද්ධියක් ඇතිවූ විට 100% එම මුදල් ප්‍රමාණය සඳහා පමණක් ප්‍රමාණානුකූල අගයට ගණනය කරන ලද අමතර වාරිකයක් ගෙවීම මගින් රක්ෂිතයා විසින් මෙම රක්ෂණ ඔප්පුව ප්‍රතිස්ථාපනය කළ යුතුය.

මෙම ඔප්පුවේ පටහැනිව යමක් සඳහන් වුවද, ඒ පිළිබඳව නොසලකාම, රක්ෂණ සමාගම විසින් ඔප්පුවට එකතුකර ඇති ත්‍රස්තවාදී ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, රක්ෂිතයාට ප්‍රමාණානුකූල ආපසු ගෙවීමක් අනුමත කරනු ලැබේ. කෙසේවෙතත්, රක්ෂිතයාගේ ඉල්ලීම මත මෙම ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, කිසිම වාරික ආපසු ලබාදීමක් කරනු නොලැබේ.

මෙම දීර්ඝ කිරීම පහත සඳහන්කර ඇති ව්‍යතිරේකයනට යටත්වන බව තවදුරටත් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ:

### 27 වෙනි වගන්තිය - ත්‍රස්තවාදී පිටසන රියදුරු / පිරිසිදු කරන්නා / රිය සහායක සඳහා මෝටර් යටතේ කම්කරු වන්දි රක්ෂණය

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවට අමුණා ඇති කම්කරු වන්දි රක්ෂණ පිටසනෙහි විධිවිධාන (අ) ට පටහැනි වුවද ඒ පිළිබඳව නොසලකා මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලබන්නේ, එමගින් සපයා ඇති ආවරණය, උපලේඛනයේ විස්තර කර ඇති කාණ්ඩයට අයත් සේවකයන්හට යම් ත්‍රස්තවාදී ක්‍රියාවකට සෘජුව සම්බන්ධ වූ හෝ ඒ හේතුව නිසා සිදුවන මරණය හෝ ශාරීරික තුවාල වෙනුවෙන් වන්දි ලබාදීම සඳහා දීර්ඝ කරනු ලබන බවයි. යම් ත්‍රස්තවාදී ක්‍රියා යන්නෙහි තේරුම, බලය හෝ ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීම ඇතුළුව නමුත් එයට සීමා නොවූ ක්‍රියාවක් සහ / හෝ දේශපාලනික, ආගමික, සංකල්පවේදීය හෝ යම් රජයකට බලපෑම් කිරීමේ අරමුණු ඇතුළු සහ / හෝ මහජනතාව හෝ මහජනතාවෙන් යම් කොටසක් බියගැන්වීමේ අරමුණ ඇතුළු ජනවාර්ගික අරමුණු හෝ හේතු සහිතව තනිව ක්‍රියාකරන හෝ යම් සංවිධානයක් හෝ රජයක් වෙනුවෙන් ක්‍රියාකරන යම් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් එසේ බියගැන්වීමේ ක්‍රියාවයි.

තවද, රජයේ ආරක්ෂක හමුදාවත් ඉහත විස්තර කර ඇති යම් කණ්ඩායමක් අතර යම් ක්‍රියාදාමයක් පාලනය කිරීම, වැළැක්වීම, මැඩපැවැත්වීම සඳහා ගොඩබිමේ දී, සයුරේ දී හෝ ගුවනේ දී ඇතිවන යම් ගැටුමක සෘජුව හෝ වක්‍රව ඇතිවූ යම් අලාභයක්, හානියක්, කුමන ආකාරයක හෝ පිරිවැය හෝ වියදම ද ඉහත සඳහන් කර ඇති ත්‍රස්තවාදය යන අර්ථකථනයට අන්තර්ගත වේ.

මෙම පිටසන යටතේ ගෙවනු ලබන වන්දි ප්‍රමාණය, එක් සේවකයකු සඳහා රුපියල් 550,000/- නොඉක්මවන අතර, පොදු නීතිය යටතේ ඇති වගකීම් හැර, රාජකාරියෙහි යෙදී සිටින විටදී ඇතිවන සිදුවීම් සඳහා පමණක් සීමාකර ඇත.

මෙම ඔප්පුවේ පටහැනිව යමක් සඳහන් වුවද, ඒ පිළිබඳව නොසලකාම, රක්ෂණ සමාගම විසින් ඔප්පුවට එකතුකර ඇති ත්‍රස්තවාදී ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, රක්ෂිතයාට ප්‍රමාණානුකූල ආපසු ගෙවීමක් අනුමත කරනු ලැබේ. කෙසේවෙතත්, රක්ෂිතයාගේ ඉල්ලීම මත මෙම ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, කිසිම වාරික ආපසු ලබාදීමක් කරනු නොලැබේ.

මෙම දීර්ඝ කිරීම පහත සඳහන්කර ඇති ව්‍යතිරේකයනට යටත්වන බව තවදුරටත් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ:

### 28 වෙනි වගන්තිය - බස්රථයේ රියදුරු / කොන්දොස්තර / පිරිසිදු කරන්නා / රිය සහායක කම්කරු යන අය සඳහා ත්‍රස්තවාදී හදිසි අනතුරු ආවරණය

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන, මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලබන්නේ, මෙම ඔප්පු

උපලේඛනයේ විස්තර කර ඇති රක්ෂිතයා වෙනුවෙන් සේවයේ යෙදී සිටින විටදී රියදුරු / කොන්දොස්තර / පිරිසිදු කරන්නා / රිය සහායක කම්කරු යන අයට, යම් ත්‍රස්තවාදී ක්‍රියාවකට සෘජුව සම්බන්ධ වූ හෝ ඒ හේතුව නිසා සිදුවන මරණය හෝ පූර්ණ සහ සදාකාලික අකර්මණ්‍යතාවය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල සහ ත්‍රස්තවාදය වෙනුවෙන් රුපියල් ලක්ෂයක (රු. 100,000/-) මුදලක් ගෙවීමට සමාගම පොරොන්දු වන බවයි. යම් ත්‍රස්තවාදී ක්‍රියා යන්නෙහි තේරුම, බලය හෝ ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීම ඇතුළුව නමුත් එයට සීමා නොවූ ක්‍රියාවක් සහ / හෝ දේශපාලනික, ආගමික, සංකල්පවේදීය හෝ යම් රජයකට බලපෑම් කිරීමේ අරමුණු ඇතුළු සහ / හෝ මහජනතාව හෝ මහජනතාවෙන් යම් කොටසක් බියගැන්වීමේ අරමුණ ඇතුළු ජනවාර්ගික අරමුණු හෝ හේතු සහිතව තනිව ක්‍රියාකරන හෝ යම් සංවිධානයක් හෝ රජයක් වෙනුවෙන් ක්‍රියාකරන යම් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් එසේ බියගැන්වීමේ ක්‍රියාවයි.

තවද, රජයේ ආරක්ෂක හමුදාවත් ඉහත විස්තර කර ඇති යම් කණ්ඩායමක් අතර යම් ක්‍රියාදාමයක් පාලනය කිරීම, වැළැක්වීම, මැඩපැවැත්වීම සඳහා ගොඩබිමේ දී, සයුරේ දී හෝ ගුවනේදී ඇතිවන යම් ගැටුමක සෘජුව හෝ වක්‍රව ඇතිවූ යම් අලාභයක්, හානියක්, කුමන ආකාරයක හෝ පිරිවැය හෝ වියදම ද ඉහත සඳහන් කර ඇති ත්‍රස්තවාදය යන අර්ථකථනයට අන්තර්ගත වේ.

එතෙකුදු වූවද, පහත සඳහන් අවස්ථාවන්වලදී ගෙවීම් කරනු නොලැබේ:

අ. එක් රක්ෂිත කාලසීමාවකදී පුද්ගලයින් සිවු දෙනෙකුට වඩා වැඩි ගණනකට ගෙවීම් කරනු නොලැබේ. කෙසේවෙතත්, හිමිකමක් ඉදිරිපත් කරනු ලැබූ විට, අදාලවන පරිදි වාරික මුදලේ 100% ක් ගෙවා ආවරණය ප්‍රතිස්ථාපනය කළ හැකිය.

ආ. වෙනත් කිසිදු හේතුවක් සම්බන්ධ නොවී (එවන් සිද්ධියක් මුල්කරගෙන කරනු ලබන වෛද්‍ය හෝ ශල්‍ය වෛද්‍ය ප්‍රතිකාර හැර) එවන් ක්‍රියාවක සෘජු ප්‍රතිඵලයක් මගින් එකී සිදුවීම සිදුවූ දින සිට ලිත් මාස තුනක් (03) ඇතුලත මරණය සිදුවී නොතිබුණහොත්.

රක්ෂිතයාගේ අනුමැතිය මත පමණක් ගෙවීම් සිදුකරනු ලබන අතර, එය සෘජුවම මියගිය අයගේ නීත්‍යානුකූල පෞද්ගලික නියෝජිතයින් වෙත ගෙවනු ලැබේ. ඔවුන්ට එම මුදල ලැබීම, සමාගම සියළු වගකීම්වලින් වලංගු ලෙස මුදාහැරීමක් වශයෙන් සලකනු ලැබේ.

මෙම ඔප්පුවේ පටහැනිව යමක් සඳහන් වූවද, ඒ පිළිබඳව නොසලකාම, රක්ෂණ සමාගම විසින් ඔප්පුවට එකතුකර ඇති ත්‍රස්තවාදී ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, රක්ෂිතයාට ප්‍රමාණානුකූල ආපසු ගෙවීමක් අනුමත කරනු ලැබේ. කෙසේවෙතත්, රක්ෂිතයාගේ ඉල්ලීම මත මෙම ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, කිසිම වාරික ආපසු ලබාදීමක් කරනු නොලැබේ.

මෙම දීර්ඝ කිරීම පහත සඳහන්කර ඇති ව්‍යතිරේකයනට යටත්වන බව තවදුරටත් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ:

**29 වෙනි වගන්තිය -**
**බස්රථයේ ගමන් ගන්නා මගීන් සඳහා ත්‍රස්තවාදී හදිසි අනතුරු ආවරණය**

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවා තිබීම සැලකිල්ලට ගෙන, මෙයින් ප්‍රකාශ කොට ගිවිසගනු ලබන්නේ,
මෙම ඔප්පු උපලේඛනයේ විස්තර කර ඇති බස් රථයේ ගමන්ගන්නා එක් මගියෙක් සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් ඔප්පුවේ සඳහන් මුදලක් ගෙවීමට සමාගම පොරොන්දු වන බවයි. යම් ත්‍රස්තවාදී ක්‍රියා යන්නෙහි තේරුම, බලය හෝ ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීම ඇතුළුව, නමුත් එයට සීමා නොවූ ක්‍රියාවක් සහ / හෝ දේශපාලනික, ආගමික, සංකල්පවේදීය හෝ යම් රජයකට බලපෑම් කිරීමේ අරමුණු ඇතුළු සහ / හෝ මහජනතාව හෝ මහජනතාවෙන් යම් කොටසක් බියගැන්වීමේ අරමුණ ඇතුළු ජනවාර්ගික අරමුණු හෝ හේතු සහිතව තනිව ක්‍රියාකරන හෝ යම් සංවිධානයක් හෝ රජයක් වෙනුවෙන් ක්‍රියාකරන යම් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් විසින් එසේ බියගැන්වීමේ ක්‍රියාවයි.

තවද, රජයේ ආරක්ෂක හමුදාවත් ඉහත විස්තර කර ඇති යම් කණ්ඩායමක් අතර යම් ක්‍රියාදාමයක් පාලනය කිරීම, වැළැක්වීම, මැඩපැවැත්වීම සඳහා ගොඩබිමේ දී, සයුරේ දී හෝ ගුවනේ දී ඇතිවන යම් ගැටුමක සෘජුව හෝ වක්‍රව ඇතිවූ යම් අලාභයක්, හානියක්, කුමන ආකාරයක හෝ පිරිවැය හෝ වියදම ද ඉහත සඳහන් කර ඇති ත්‍රස්තවාදය යන අර්ථකථනයට අන්තර්ගත වේ.

රක්ෂිතයාගේ අනුමැතිය මත පමණක් ගෙවීම් සිදුකරනු ලබන අතර, එය සෘජුවම මියගිය අයගේ නීත්‍යානුකූල පෞද්ගලික නියෝජිතයින් වෙත ගෙවනු ලැබේ. ඔවුන්ට එම මුදල ලැබීම, සමාගම සියළු වගකීම්වලින් වලංගු ලෙස මුදාහැරීමක් වශයෙන් සලකනු ලැබේ.

මෙම ඔප්පුවේ පටහැනිව යමක් සඳහන් වූවද, ඒ පිළිබඳව නොසලකාම, රක්ෂණ සමාගම විසින් ඔප්පුවට එකතුකර ඇති ත්‍රස්තවාදී ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, රක්ෂිතයාට ප්‍රමාණානුකූල ආපසු ගෙවීමක් අනුමත කරනු ලැබේ. කෙසේවෙතත්, රක්ෂිතයාගේ ඉල්ලීම මත මෙම ආවරණය අවලංගු කරනු ලැබුවහොත්, කිසිම වාරික ආපසු ලබාදීමක් කරනු නොලැබේ.

මෙම දීර්ඝ කිරීම පහත සඳහන්කර ඇති ව්‍යතිරේකයනට යටත්වන බව තවදුරටත් ප්‍රකාශකොට ගිවිසගනු ලැබේ:

# වාරික ගෙවීම පිළිබඳ ප්‍රතිඥාභාරය (PREMIUM PAYMENT WARRANTY)

1. මෙහි අඩංගු කිසිවක් පටහැනිවුවද, මෙහිලා සඳහන් 2 වෙනි සහ 3 වෙනි වගන්තිවලට යටත්ව, මෙයින් එකහත්වයෙන් ප්‍රකාශ කරනු ලබන්නේ, හිඟව පවතින සහ මෙම රක්ෂණය සඳහා ගෙවිය යුතුව තිබෙන සම්පූර්ණ වාරික මුදල සමාගම සමග එකඟවී ඇති අදාල දිනයේදී (ඉහත දිනය වන්නේ, ඔප්පුව ආරම්භවූ දිනයේ සිට දින හැටක් (60) නොඉක්මවන දිනයකි) හෝ එයට පෙර රක්ෂණ සමාගමට ගෙවිය යුතුවන අතර, එවන් නිශ්චිත දිනයක් නොමැති අවස්ථාවකදී සම්පූර්ණ වාරික මුදලම මෙම ඔප්පුව ආරම්භවූ දින හෝ අලුත් කිරීමේ සහතික දින හෝ පිටසනක් යොදන ලද දින හෝ තාවකාලික ඔප්පුවක් නිකුත්කරන ලද දින සිට (මින්මතු “අදාළ දිනය” වශයෙන් හඳුන්වනු ලැබේ) දින හැටක් (60) ඉකුත්වීමට මත්තෙන් ගෙවිය යුතුවන බවයි.

   මෙම ප්‍රතිඥාභාරයේ අරමුණ සඳහා ආවරණය ආරම්භවන දිනය, “අදාළ දිනය” වශයෙන් පිළිගනු ලැබේ.

2. තවද එකහත්වයෙන් ප්‍රකාශ කරනු ලබන්නේ, අදාල දිනට පෙර සම්පූර්ණ රක්ෂිත මුදල ගෙවීම යනු රක්ෂණ සමාගමෙහි වගකීම හෝ මෙම ඔප්පුව, පිටසන හෝ තාවකාලික රක්ෂණය යටතේ වූ වගකීම ඉටුකිරීමට පූර්ව කොන්දේසියක් වනු ඇති බවයි.

   මෙම රක්ෂණයේ ආරම්භක දිනය සහ වාරිකය ගෙවිය යුතුවන “අදාළ දිනය” අතර කාලය තුල යම් හිමිකමක් ඉදිරිපත් කරනු ලැබුවහොත් “අදාළ දිනයේ” හෝ ඊට පෙර සම්පූර්ණ වාරිකයම ගෙවනු ලබන තෙක් සමාගම විසින් එවන් යම් වගකීමක් භාරගැනීම සම්බන්ධ තම තීරණය හෝ හිමිකමක් ගෙවීමක් කල්දැමීය හැකිය.

3. තවද එකහත්වයෙන් ප්‍රකාශ කරනු ලබන්නේ, “අදාළ දිනයේ” රක්ෂණ සමාගමෙහි ව්‍යාපාරය අවසන්වන අවස්ථාව වනවිට මේ යටතේ ගෙවිය යුතුවන සම්පූර්ණ වාරික මුදල හිඟව පැවතියහොත්, මෙම රක්ෂණය යටතේවූ ආවරණය සහ මෙම රක්ෂණය යටතේ ඇති වගකීම අවලංගු කරනු ලබන හෝ නවත්වනු ලබන හෝ වහාම නිශ්ප්‍රභ කරනු ලබන බවයි.

4. කෙසේවුවද, ඉහත සඳහන්කළ පරිදි අවලංගු කිරීම මගින් යම් නීතිමය විත්ති වාචකයක් ඉදිරිපත් කිරීමට හෝ කල්ඉකුත්වූ රක්ෂණ කාලසීමාව සඳහා නොගෙවා ඇති සම්පූර්ණ වාරික මුදල හෝ ඉන් කොටසක් අයකරගැනීමට ඇති සමාගමෙහි අයිතියට කිසිම අගතියක් ඇතිනොවනු ඇත.

# මෝටර් රථ පදවන්නන්හට වැදගත් නිවේදනය

## පොලිස් වාර්තාව

මෝටර් රථ වාහන පනතේ 161 (1) (අ) වගන්තිය ප්‍රකාරව, මහාමාර්ගයක වාහනයක් පදවමින් සිටින අවස්ථාවේදී හදිසි අනතුරුවලට මුහුණ දෙන සෑම රියදුරෙක්ම එවන් හදිසි අනතුරක් සම්බන්ධයෙන් ළඟම පිහිටි පොලිස් ස්ථානයට ඒ පිළිබඳව දැනුම්දිය යුතු යයි අපේක්ෂා කෙරේ. එම නිසා රක්ෂණ සහතිකයක් ඇති සියලුම ඔප්පු හිමියන් මෙය පිළිපැදි යුතුයැයි ඉල්ලා සිටිනු ලැබේ. හිමිකමක් ඉතා කුඩා හිමිකමක් වන අවස්ථාවේදී කොන්ටිනන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් මෙම අවශ්‍යතාවය අත්හැරිය හැකිය.

කෙසේවුවද, පොලීසියට හිමිකම් පිළිබඳ දත්ත සැපයීමේ අවශ්‍යතාවය පිළිබඳ මෝටර් රථ වාහන පනතේ 161 (ඇ) වගන්තිය පිළිපැදීම තහවුරු කිරීම පහසුකරලීම සඳහා හිමිකම් සකසන නිලධාරියා වෙත AIB යොමු අංකය දුරකථනය මගින් සපයන ලෙස රක්ෂිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙය පිළිපැදීමට අපොහොසත් වුවහොත් 2009 ජූලි මස 1වෙනි දින සිට ක්‍රියාත්මක වූ නීතියෙහි අදාළ වගන්ති යටතේ රථවාහන පදවන්නාට මෙන්ම රක්ෂණ සමාගමටද දඩයක් ගෙවීමට සිදුවේ.

## රක්ෂණය මාරුකිරීම

1951 අංක 14 දරණ මෝටර් රථවාහන පනත යටතේ අනිවාර්ය තෙවෙනි පාර්ශව හිමිකම් රක්ෂණාවරණය අදාළවනතාක්කල්, මෝටර් රථවාහන පනතේ අංක 112(අ) වෙනි වගන්තිය යටතේ රක්ෂණ සහතිකයක් පැවරීම සමාගම විසින් පිළිගතහොත් එය එසේ පවරනලද දින සිට දින 44ක් පමණක් වලංගුවන බවට මෝටර් රථවාහන පදවන්නන්හට සහ ඔප්පුහිමියන් හට දැනුම් දෙනු ලැබේ. මෙම පිළිගැනීම රක්ෂණ ඔප්පුවෙහි පූර්ණ ආවරණය යටතේ ලබාදී ඇති අනෙකුත් යම් ආවරණ සඳහා දීර්ඝ කරනු නොලැබේ. යම් රක්ෂිත උවදුරකින් තම වාහනයට සිදුවන අලාභ හෝ හානිවලට එරෙහිව රක්ෂණ ආවරණයක් ලබාගැනීමට අදහස් කරන යම් මෝටර් රථවාහන පැවරුම්ලාභියකු පැවරීමේ නීතියමය ලේඛන සහ වාහනයේ අයිතිය තමන්හට ලැබූ විගස කොන්ටිනන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්හි ඕනෑම නිලධාරියකු හා සම්බන්ධවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. එසේ කරනවිට අවශ්‍ය කරුණු හෙළිකළ යුතු අතර, ඉල්ලා ඇති ආකෘතිය අනුව කොන්ටිනන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් වෙත ප්‍රකාශයක්ද නිකුත්කළ යුතුය. මෙසේ කිරීමට අපොහොසත්වුවහොත් වාහනය සඳහා ලබාදී ඇති රක්ෂණ ආවරණය වාහනයෙහි පැවරුම නව ගැනුම්කරුට ලබාදුන් දින සිට ක්‍රියාත්මකවීම නවත්වනු ලැබේ.